# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,897—1970 මාර්තු 13 වැනි සිකුරාද—1970.3.13

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය ... ... | 191 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | 192 |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... ... | 195 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 196 |
| මිළ පාලන දන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දන්වීම් ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දන්වීම් ... ... ... | 207 |
| " සුරාබදු ආඥාපනත " පිළිබඳ දන්වීම් ... ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය

**1970 අංක 81**

අංකය ඩී. 21/ආර්ජ්සීපී/381.

**යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—රජය පාලනය කරවන උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි තැන 1970 පෙබරවාරි මස 20 වෙනි දින සිට යුද්ධ හමුදා ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගෙන ඇත:—

ලුතිනන් කර්නල් බෙල්ලනගේ පර්සි ප්‍රනාන්දු ජයරත්න, ල. යු. පොදු. සේ. බ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. වී. පී. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 මාර්තු 2 දින,
කොළඹ දීය.

3-127

**1970 අංක 82**

අංකය ඩී/වීඑෆ්ජ්/34(ඩී).

**යුද්ධ හමුදව—ලංකා සෙවච්ඡා බලසේනාව—රජය පාලනය කරවන උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද නිලයෙහි ස්ථිර කිරීම් සහ උසස් කිරීම්**

1970 ජනවාරි මස 1 වැනි දින සිට කපිතාන්වරුන් වශයෙන්:—

ලුතිනන් (තාවකාලික කපිතාන්) රවීන්ද්‍ර විශාල් ජයවර්ධන, ල.පා.හ.

ලුතිනන් සෙම්බුකුට්ටිආරච්චිගේ බෙනඩික් ගාබ්‍රියෙල් ද සිල්වා, ල.පා.හ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. වී. පී. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 පෙබරවාරි 27 දින,
කොළඹ දීය.

3-125

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ඇල්. ඩබ්ලිව්. ඩී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

**1970 අංක 83**

අංකය : ඩී/වීඑෆ්/38 (III).

## යුද්ධ හමුදුව—ලංකා සෙවච්ඡා බල සේනාව—රජය පාලනය කරවන උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම් හා ඇතුලත් කිරීම්

1970 ජනවාරි මස 1 වැනි දින සිට, පහත නම් සඳහන් මහත්වරුන්, පිළිවෙලින් පහත දක්වා ඇති ජ්‍යෙෂ්ඨත්වය ඇතිව, යුද්ධ හමුදුවේ සෙවච්ඡා බලසේනාවේ දෙවන ලුතිනන් වරුන් වශයෙන් අධිකාරියට පත් කිරීම සහ ඔවුන්ගේ නම් වලට ඉහලින් පෙන්වා ඇති ඒකකවලට ඇතුලත් කිරීම රජය පාලනය කරවන උතුමාණන් වහන්සේ විසින් සතුටින් අනුමත කර ඇත :—

(අ) අධිකාරියට පත් කිරීම්

දෙන් ෂෙල්ටන් කැනිෂස් ගනේගොඩ මහතා.
අනිල් සුමේධ අමරසේකර මහතා.
රත්පටබැඳිගේ නිහාල් වීරවර්ණ තිලවීර මහතා.
කුරුවකන්කානගේ ප්‍රේමලාල් නන්ද ප්‍රනාන්දු මහතා.

(ආ) ඇතුලත් කිරීම්

**2 වැනි (සෙවච්ඡා) බළඇණිය, ලංකා පාබල හමුදුව**

දෙවන-ලුතිනන් කුරුවකන්කානගේ ප්‍රේමලාල් නන්ද ප්‍රනාන්දු

**2 වැනි (සෙවච්ඡා) බළඇණිය, ලංකා සිංහ රෙජිමේන්තුව**

දෙවන-ලුතිනන් රත්පටබැඳිගේ නිහාල් වීරවර්ණ තිලවීර

**2 වැනි (සෙවච්ඡා) බළඇණිය, ගැමුණු සේවා බලකාය**

දෙවන-ලුතිනන් අනිල් සුමේධ අමරසේකර

**ලංකා යුද්ධ හමුදු සේවා බලකාය (සෙවච්ඡා)**

දෙවන-ලුතිනන් දෙන් ෂෙල්ටන් කැනිෂස් ගනේගොඩ

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. වී. පී. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු
අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1970 පෙබරවාරි 26 දින,
කොළඹදී ය.

3-91

---

**1970 අංක 84**

අංකය ඩී. 202/ආර්ජිසිපී.

## රාජකීය ලංකා නාවික හමුදාව—ස්ථිර බල හමුදාව—රජය පාලනය කරවන උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

1970 මාර්තු 16 වැනි දින සිට කොමදෝරු වශයෙන් :—

කපිතාන් ඩොනල්ඩ් වික්ටර් හන්ටර්, රාලංනාහ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. වී. පී. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු
අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1970 මාර්තු මස 3 වැනි දින,
කොළඹ දීය.

3-128/1

---

**1970 අංක 85**

අංකය ඩී. 202/ආර්ජිසිපී.

## (358 වැනි අධිකාරය වන) නාවික හමුදා පනත

රජය පාලනය කරවන උතුමාණන් වහන්සේ විසින් (358 වැනි අධිකාරය වන) නාවික හමුදා පනතේ 8 (1) වැනි වගන්තිය යටතේ, 1970 මාර්තු 16 වැනි දින සිට කොමදෝරු ඩොනල්ඩ් වික්ටර් හන්ටර්, රාලංනාහ, නාවික හමුදාධිපති වශයෙන් වැඩ බැලීමට සතුටින් පත් කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. වී. පී. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු
අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1970 මාර්තු මස 3 වැනි දින,
කොළඹ දීය.

3-128/2

---

**1970 අංක 86**

අංකය : ඩී. 252/ආර්ජිසිපී/3.

## රාජකීය ලංකා ගුවන් හමුදුව—රජය පාලනය කරවන උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්

1970 ජනවාරි මස 1 වෙනි දින සිට ස්කොඩ්රන් ලීඩර්වරු වශයෙන් :—

ෆ්ලයිට් ලුතිනන් (තාවකාලික ස්කොඩ්රන් ලීඩර්) ගොලුව මරක්කලගේ උපාලි ද සිල්වා (01062) පාලන.

ෆ්ලයිට් ලුතිනන් (තාවකාලික ස්කොඩ්රන් ලීඩර්) ජෝෂප් පරරාජ්සිංගම් එලියතම්බි (01063) කාර්මික/සංඥ.

ෆ්ලයිට් ලුතිනන් (තාවකාලික ස්කොඩ්රන් ලීඩර්) පසියාගලගේ නොයෙල් සරතපාල ප්‍රනාන්දු (01065) මෙහෙයවීම්/ගුවන්.

ෆ්ලයිට් ලුතිනන් (තාවකාලික ස්කොඩ්රන් ලීඩර්) ජෝෂප් තිමොති රෙක්ස් ප්‍රනාන්දු (01066) පාලන.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. වී. පී. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 පෙබරවාරි 26 දින,
කොළඹදීය.

3-92

---

**1970 අංක 87**

අංකය : ඩී 252/ආර්ජිසිපී/3.

## රාජකීය ලංකා ගුවන් හමුදුව—රජය පාලනය කරවන උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්

1970 ජනවාරි මස 1 වෙනි දින සිට තාවකාලික ස්කොඩ්රන් ලීඩර් වශයෙන් :—

ෆ්ලයිට් ලුතිනන් ඇලෙන්සිස් බ්‍රෙන්ඩන් සෝසා (01073) පාලන/රෙජිමේන්තු.

ෆ්ලයිට් ලුතිනන් ඇන්ටොනි විලියම් ජෝශප් (01075) පාලන/අධ්‍යායන.

ෆ්ලයිට් ලුතිනන් දෙමින්ගු සරත් ගුණසිරි විතාන (01076) පාලන/අධ්‍යායන.

ෆ්ලයිට් ලුතිනන් නූර් රහිම් රහීම් (01080) පොදු සේවා/නියමු.

ෆ්ලයිට් ලුතිනන් පටබැඳිගේ ෆ්‍රෙඩ් සිරිපාල ජයසූරිය (01082) පාලන.

ෆ්ලයිට් ලුතිනන් සාක්‍යසේන අතුකෝරාල (01087) කාර්මික/ඉංජිනේරු.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ජී. වී. පී. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්

1970 මාර්තු 2 දින,
කොළඹදීය.

3-129

---

# අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

**1970 අංක 88**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේ ය :—

අංකය : සීජේපී/ඒ. 14/68

සී. අමරසිංහ මහතා 1970 මාර්තු මස 4 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, හෝමාගම පියිපි මහෙස්ත්‍රාත් උසාවියේ ක්‍රියා කරන කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්,

අංකය : ජේඑල්/සී. 6/69

එම්. එස්. එස්. කොරයා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඊ එස්. බූල් මහතා 1970 මාර්තු මස 3 දින සිට 9 දින දක්වා, හම්බන්තොට අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, සහ තංගල්ලේ අතිරේක මසේත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 28/63.

කේ. වී. ස්වර්නාධිපති මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එච්. බීඩී පෙරේරා මහතා 1970 මාර්තු මස 3 දින සිට 5 දින දක්වා, කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩබ්ලිව්. 13/67

එන්. එස්. විජේරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එම්. ඕ. එම්. තහීර් මහතා 1970 මාර්තු මස 4 සහ 5 වැනි දිනයන් හී, මහව ක්‍රියා කරන කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය: ජේඑල්/ඩබ්ලිව්. 11/64

එස්. ජේ. ඩී. ද එස්. විජයරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එම්. ජේ. පීරිස් මහතා 1970 මාර්තු මස 14 දින සිට 18 වැනි දින දක්වා, බදුල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/සී. 30/66

ජී. සී. ඩබ්ලිව්. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. සේරසිංහ මහතා 1970 මාර්තු මස 3 දින සිට 9 දින දක්වා, තංගල්ල අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ හම්බන්තොට අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 29/63.

එම්. ෂන්මුගලිංගම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, පී. විජයරත්නම් මහතා 1970 මාර්තු මස 2 සහ 3 වැනි දිනයන් හී, නුවරඑළියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ හැටන් හී ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 25/61

ජේ. බී. සී. ස්වාරිස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. එම්. එල්. ද සිල්වා මහතා 1970 මාර්තු මස 3 දින සිට 6 දින දක්වා, නුවරඑළියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ බදුල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 31/65

ඩී. එස්. ඩී. පී. ආර්. සේනානායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එච්. එස්. ඒ. පෙරේරා මහතා 1970 මාර්තු මස 3 දින සිට 10 වැනි දින දක්වා, කුලියාපිටියේ පළාත් ආණ්ඩු සභා සීමාව තුළ, කනදුල්ලේ පිහිටි උසාවියේ ක්‍රියා කරන කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩබ්ලිව්. 18/69

වී. එන්. ඒ. ඩබ්ලිව්. වික්‍රමසූරිය මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඩී. සී. ඊ. වී. කරුණාරත්න මහතා 1970 මාර්තු මස 1 වැනි දින, මීගමුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩබ්ලිව්. 18/69

වී. එන්. ඒ. ඩබ්ලිව්. වික්‍රමසූරිය මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. එල්. ප්‍රනාන්දු පුල්ලේ මහතා 1970 මාර්තු මස 4 සහ 5 වැනි දිනයන් හී, මීගමුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩී. 20/57

බී. ඊ. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ටී. ආසීර්වාදම් මහතා 1970 මාර්තු මස 3 දින සිට 9 දින දක්වා, රත්නපුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් වශයෙන්.

අංකය : ජේඑල්/ඩී. 17/55

එන්. දේවේන්ද්‍ර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. සිවගුරුනාදන් මහතා 1970 මාර්තු මස 1 දින, කොළඹ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එම්. 11/62

සී. ඊ. මෙන්ඩිස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, පී. ඊ. වී. බොතේජු මහතා 1970 මාර්තු මස 4 සහ 5 වැනි දිනයන් හී, කොළඹ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන; අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ දෙහිවල ගල්කිස්ස අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඒ. 10/63

ජී. එෆ්. එච්. අතුරුපාන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එම්. එම්. විජේසූරිය මහතා 1970 මාර්තු මස 4 සහ 5 වැනි දිනයන් හී, කොළඹ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ දෙහිවල ගල්කිස්ස අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 33/67

ඒ. සයිමන් සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එච්. ඊ. එස්. වික්‍රමරත්න මහතා 1970 මාර්තු මස 4 සහ 5 වැනි දිනයන් හී, නාරාහේන්පිට පිහිටි උසාවියේ ක්‍රියා කරන කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩබ්ලිව්. 15/69

එල්. එච්. ජී. වීරසේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, රෙක්ස් වික්‍රමසිංහ මහතා 1970 මාර්තු මස 4 දින සිට 8 වැනි දින දක්වා, ගාල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය: ජේඑල්/පී. 7/67

කේ. පාලකිඩ්නර් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. එම්. එම්. කාසිම් මහතා 1970 පෙබරවාරි මස 26 සහ 27 වැනි දිනයන් හී, පුත්තලමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/පී. 7/67

කේ. පාලකිඩ්නර් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. එම්. එම්. කාසිම් මහතා 1970 මාර්තු මස 3 දින සිට 7 දින දක්වා පුත්තලමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඒ. 2/48.

ඩී. සෙන්ට්. ඊ. අමරසිංහ මහතා 1970 මාර්තු මස 4 සහ 5 වැනි දිනයන් හී, අවිස්සාවේල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය: ජේඑල්/ඒ. 11/65

ජේ. ජී. ආසිරිවාදම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඩී. සෙන්ට් ඊ. අමරසිංහ මහතා 1970 මාර්තු මස 3 දින සිට 9 වැනි දින දක්වා, අවිස්සාවේල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ආර්. 9/54

වී. ජේ. රාජරත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඩී. ආර්. ජයකොඩි මහතා 1970 මාර්තු මස 4 දින සිට 6 දින දක්වා, කුරුණෑගල අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩී. 22/59

ටී. ඩී. ජී. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, කේ. වී. නඩරාජා මහතා 1970 මාර්තු මස 2 දින සිට 9 දින දක්වා, බදුල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ආර්. 10/58

කේ. ඒ. පී. රණසිංහ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඩබ්ලිව්. ඊ. පෙරේරා මහතා 1970 මාර්තු මස 3 දින සිට 9 වැනි දින දක්වා, ගම්පහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එම්. 9/60

එස්. ජේ. එම්. පී. එස්. මුදන්නායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඊ. එස් මාටින් මහතා 1970 මාර්තු මස 3 දින සිට 9 වැනි දින දක්වා, මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමස්රිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, දුම්බර අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ ගම්පොල අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ටී. 8/66

සී. එම්. තර්මලිංගම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, කේ. ඥානචන්ද්‍රන් මහතා 1970 පෙබරවාරි මස 26 සහ 27 වැනි දිනයන් හී, පේදුරු තුඩුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ටී. 8/66

සී. එම්. තර්මලිංගම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, කේ. ඥානචන්ද්‍රන් මහතා 1970 මාර්තු මස 3 දින සිට 5 දින දක්වා, පේදුරුතුඩුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඒ. 6/53

එම්. එම්. අබ්දුල් කාදර් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, තිස්ස ගුණරත්න මහතා 1970 මාර්තු මස 4 සහ 5 වැනි දිනයන් හී, පානදුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩී. 16/53

ඊ. එෆ්. ද සිල්වා මහතා සහ ආර්. එල්. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එන්. ජේ. වී. කුරේ මහතා 1970 මාර්තු මස 4 සහ 5 වැනි දිනයන් හී, කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩබ්ලිව්. 12/66

එන්. ඩී. ඩී. එස්. විජේසේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එච්. ඊ විජේතුංග මහතා 1970 මාර්තු මස 4 සහ 5 වැනි දිනයන් හි, කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩබ්ලිව්. 16/69

ඊ. ඒ. විජේකුලසූරිය මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඩබ්ලිව්. ඩී. පෙරේරා මහතා 1970 මාර්තු මස 4 සහ 5 වැනි දිනයන් හී, කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ජී. 13/64

එස්. බී. ගුණවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. එස්. රාජපක්ෂ මහතා 1970 මාර්තු මස 3 දින සිට 10 දින දක්වා, හලාවත සහ පුත්තලමේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ජී. 13/64

එස්. බී. ගුණවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. එස්. රාජපක්ෂ මහතා 1970 ජූනි මස 7 දින, හලාවත සහ පුත්තලමේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩී. 24/62

ජේ. ජේ. එෆ්. ඒ. ඩයස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. කනගරත්නම් මහතා 1970 මාර්තු මස 2 දින සිට 8 දින දක්වා, යාපනේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, කයිට්ස්හි අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ආර්. 12/57

පී. බී. රඹුක්වැල්ල මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එෆ්. ඩබ්ලිව්. ගුණරත්න මහතා 1970 පෙබරවාරි මස 27 දින සිට මාර්තු මස 1 වැනි දින දක්වා, මීගමුවේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ආර්. 12/57

පී. බී. රඹුක්වැල්ල මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඩී. සී. ඊ. වී. කරුණාරත්න මහතා 1970 මාර්තු මස 3 දින සිට 6 දින දක්වා, මීගමුවේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස්, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩී. 18/56

එල්. එච්. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ටී. එස්. පී. පී. ද එස්. ගුණසේකර මහතා 1970 මාර්තු මස 13 දින, බලපිටියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩබ්ලිව්. 14/67

ඩබ්ලිව්. ජී. එන්. වීරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, වර්නන් යූ. ප්‍රනාන්දු මහතා 1970 මාර්තු මස 4 සහ 5 වැනි දිනයන් හී, කළුතර අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 24/59

එස්. සෙල්ලයියා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. තියාගරාජා මහතා 1970 පෙබරවාරි මස 22 දින මාතලේ ක්‍රියා කරන මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, මාතලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ජී. 14/65

එල්. ඒ. ගුණවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එල්. ඩබ්ලිව්. ප්‍රනාන්දු මහතා 1970 මාර්තු මස 3 දින සිට 9 වැනි දින දක්වා, ගම්පොල ක්‍රියා කරන මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, ගම්පොල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/අයි. 1/51

අයි. එම්. ඉස්මයිල් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, කේ. ඊ. කදිර්ගාමලිංගම් මහතා 1970 මාර්තු මස 3 දින සිට 9 දින දක්වා, යාපනේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩී. 28/65

ජී. ජී. ඩී. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඩී. බී. එන්. ජයතිලක මහතා 1970 මාර්තු මස 4 දින සිට 8 දින දක්වා, පානදුර අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : පීඑල්/ඩී. 10/61

ඩබ්ලිව්. බී. දසනායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. කරුණාරත්න මහත්මිය 1970 පෙබරවාරි මස 15 සහ 16 වැනි දිනයන් හී, ගම්පහ දිස්ත්‍රික්කයේ නැගෙනහිර සියනෑ කෝරලේ, බටහිර සියනෑ කෝරලේ (මැද පත්තුව) සහ හාපිටිගම් කෝරලේ ගම්බද උසාවි සභාපති සහ දකුණු අළුත්කුරු කෝරලේ ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/කේ. 7/64

අයි. තිරුපාකරන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, වී. සෝමසුන්දරම් මහතා 1970 පෙබරවාරි මස 16, 18, 19, 20, 22, 23, 24, 25, 26 සහ 27 වැනි දිනයන් හී, යාපනය දිස්ත්‍රික්කයේ දිවයින් වල සහ බටහිර වලිකාමම් හී ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඒ/11/57

එස්. ඒ. යටවර මහතා 1970 මාර්තු මස 1, 2, 3, 4, 5, 9, 10, 11, 12, 13, 14, 16, 17, 18, 19, 20, 21, 24, 25, 26 28 සහ 31 වැනි දිනයන් හී, හෝ නැවත නියමයක් කරන තුරු, මාතලේ උතුරු ගම්බද උසාවි සභාපති සහ මාතලේ නැගෙනහිර අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඒ/16/57

ඩබ්ලිව්. එච්. බී. පීරිස් මහතා 1970 මාර්තු මස 1 වැනි දින සිට හඳුගල ගම්බද උසාවියේ අංක 2133 දරණ අපරාධ නඩුව ඇසීමට සහ අසා අවසාන කර තීන්දුව දීම පිණිස, ගාල්ල දිස්ත්‍රික්කයේ ගඟබොඩ හා හිනිදුම් පත්තුව, අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් සහ වැල්ලබඩ පත්තුවේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : සීජේකෘ/ඒ. 19/70

අල්හජ්. එස්. එස්. බී. එස්. එච්. කේ. මවුලානා මහතා 1970 මාර්තු මස 5 වැනි දින සිට තුන් අවුරුදු කාලයකට හෝ නැවත නියමයක් කරන තුරු, තංගල්ල අධිකරණ කොට්ඨාශයේ කාති වශයෙන්.

සිරිමෙවන් අමරසිංහ,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්.

1970 මාර්තු මස 3 දා,
කොළඹ 12, තැ. පෙ. අංක 573,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්‍යාලයේ දී.

3-191/1

---

1970 අංක 89

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන ලද ස්ථිර කිරීම්

අංකය : සීජේපී/ඩී. 30/66

ලංකා අධිකරණ සේවයේ නිලධාරියෙකු වශයෙන් වූ ජී. සී. ඩබ්ලිව්. ද සිල්වා මහතාගේ පත්වීම 1967 පෙබරවාරි මස 1 වැනි දින සිට ස්ථිර කර ඇත.

අංකය : සීජේපී/එෆ්. 3/67

ලංකා අධිකරණ සේවයේ නිලධාරියෙකු වශයෙන් වූ එෆ්. ජී. බී. ප්‍රනාන්දු මහතාගේ පත්වීම 1967 පෙබරවාරි මස 1 දින සිට ස්ථිර කර ඇත.

අංකය : සීජේපී/ඩී. 28/65

ලංකා අධිකරණ සේවයේ නිලධාරියෙකු වශයේ වූ ජී. පී. ඩී. ද සිල්වා මහතා ගේ පත්වීම 1967 පෙබරවාරි මස 1 වැනි දින සිට ස්ථිර කර ඇත.

සිරිමෙවන් අමරසිංහ,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්.

1970 මාර්තු මස 3 දා,
කොළඹ 12,
තැ. පෙ. අංකය : 573,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්‍යාලයේ දී ය.

3-191/2

---

# වෙනත් පත්කිරීම් ආදිය

1970 අංක 90

පා 4/සාවි 2/345, පා 4/සාවි 16/93, පා 4/සාවි 32/34, පා 4/සාවි 10/46, පා 4/සාවි 15/58, පා 4/සාවි 32/40, පා 4/සාවි, 16/94, පා 4/සාවි 16/71, පා 4/සාවි 17/4, පා 4/සාවි 18/10.

## අධිකරණ ආඥාපනත

82 වන වගන්තිය යටතේ දැන්වීම

(6 වන අධිකාරය වූ) අධිකරණ ආඥාපනතෙහි 82 වන වගන්තිය යටතේ මා වෙත පැවරුණු බලතල ප්‍රකාර, අධිකරණ ඇමති, ඇලෙක් සැන්ඩර් ෆ්‍රේසයර්ලි විජේමාන්න වන මම,

1. පෙරුම්බුලි අච්චිගේ දොන් රෙමානිස් මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
2. තෝමස් සේරසිංහ මහතා මාතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
3. උක්කුබණ්ඩා රාජකරුණා මහතා අනුරාධපුරය අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
4. මතුරණ ගෙදර විජේතුංග මහතා නුවරඑළිය අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
5. කාරියවසම් තන්ත්‍රීගේ ආරියපාල මහතා ගාල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
6. කිරිබණ්ඩාගේ අප්පුහාමි රාජකරුණා මහතා අනුරාධපුර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
7. මැණික් පුරගේ එඩෝරිස් මහතා මාතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
8. ආතර් කුමාරනායක මහතා තංගල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
9. දුමිංගු හේවාගේ ජිනදාස විජේසූරිය මහතා තංගල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
10. කුලරත්න සමරසේකර මහතා තංගල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

ඒ. එෆ්. විජේමාන්න,
අධිකරණ ඇමති.

1970 මාර්තු 4 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

3-110

---

1970 අංක 91

## නොතාරිස් ආඥාපනත— (107 වන අධිකාරය)

තුරෙයිසිංහම් ජෙයරාජසිංහම් මහතා කොළඹ අධිකරණ කොට්ඨාශය ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් පත් කර තිබේ.

ඇ. එ. ගොගර්ලි මොරගොඩ,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 පෙබරවාරි මස 24 වැනි දින,
කොළඹදී ය.

3-51

**1970 අංක 92**

## නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

කන්දසියා නීලකන්දන් මහතා කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පත් කර තිබේ.

ඇ. ඒ. ගෝගර්ලි මොරගොඩ,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 මාර්තු මස 2 වැනි දින,
කොළඹදී ය.

**3-198**

---

**1970 අංක 93**

## නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

ලක්ෂ්මන් සුනිල් ප්‍රේම් ජයතිලක මහතා බදුල්ල අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පත් කර තිබේ.

ඇ. ඒ. ගෝගර්ලි මොරගොඩ,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 මාර්තු මස 2 වැනි දින,
කොළඹදී ය.

**3-196**

---

**1970 අංක 94**

## නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

ඉංදිරා මිනට් වීරරත්න මෙනවිය රත්නපුර අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පත් කර තිබේ.

ඇ. ඒ. ගෝගර්ලි මොරගොඩ,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 මාර්තු මස 2 වැනි දින,
කොළඹදී ය.

**3-197**

---

# ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී.—බී. 45/51

අංක : ඩී. 239/වීආර්ජී.

## යුද්ධ හමුදා පනත

(357 වැනි අධිකාරය වන) යුද්ධ හමුදා පනතේ 155 වන වගන්තිය යටතේ ආරක්ෂක හා විදේශ කටයුතු ඇමති විසින් පනවනු ලැබූ නියෝගය.

ඩඩ්ලි සේනානායක,
ආරක්ෂක හා විදේශ කටයුතු ඇමති.

1970 පෙබරවාරි මස 27 දින,
කොළඹ දී ය.

**නියෝගය**

1955 සැප්තැම්බර් මස 16 වැනි දින අංක 10,839 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගයෙන් සංශෝධනය කරන ලද 1951 දෙසැම්බර් මස 21 වැනි දින අංක 10,332 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ, 1951 යුද්ධ හමුදා (විදේශීය) අභ්‍යාස නියෝනවල 5 වැනි නියෝගය පහත සඳහන් පරිදි සංශෝධනය කිරීබෙන් ඒ නියෝග මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි (2) වැනි ඡෙදයෙහි "රාජෝත්තමයාණන් වහන්සේගේ නාවික හමුදාවට හෝ ගුවන් හමුදාවට අයත්" යන වචන වෙනුවට "යම් නාවික හමුදාවකට හෝ ගුවන් හමුදාවකට අයත්" යන වචන ආදේශ කිරීමෙන් ; හා

(2) එහි (4) වැනි ඡෙදයෙහි "එක්සත් රාජධානියේ එවකට බැඳී පවත්වන නාවික, යුද්ධ හා ගුවන් හමුදා නීතිය" යන වචන වෙනුවට "ඒ පුහුණුවීමේ ආයතනය, නැව, ගුවන් යානය හෝ සංක්‍රමණ කඳවුර අයත් රටෙහි නීතිය" යන වචන ආදේශ කිරීමෙන්.

**3-173/1**

---

එල්. ඩී.—බී. 60/53

අංක : ඩී. 239/වීආර්ජී.

## නාවික හමුදා පනත

(358 වැනි අධිකාරය වන) නාවික හමුදා පනතේ 161 වන වගන්තිය යටතේ ආරක්ෂක හා විදේශ කටයුතු ඇමති විසින් පනවනු ලද නියෝගය.

ඩඩ්ලි සේනානායක,
ආරක්ෂක හා විදේශ කටයුතු ඇමති.

1970 පෙබරවාරි මස 27 දින,
කොළඹ දී ය.

**නියෝගය**

1955 සැප්තැම්බර් මස 16 වැනි දින අංක 10,839 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ, 1955 නාවික හමුදා (විදේශීය) අභ්‍යාස නියෝගවල 4 වන නියෝගය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි (2) වන ඡේදයෙහි "රාඥීන් වහන්සේගේ නාවික හමුදාවට හෝ ගුවන් හමුදාවට අයත්" යන වචන වෙනුවට "යම් නාවික හමුදාවකට හෝ ගුවන් හමුදාවකට අයත්" යන වචන ආදේශ කිරීමෙන් ; හා

(2) එහි (4) වැනි ඡෙදයෙහි "එක්සත් රාජධානියේ එවකට බැඳී පවත්වන නාවික, යුද්ධ හා ගුවන් හමුදා නීතිය" යන වචන වෙනුවට "ඒ පුහුණුවීමේ ආයතනය, නැව, ගුවන් යානය හෝ සංක්‍රමණ කඳවුර අයත් රටෙහි නීතිය" යන වචන ආදේශ කිරීමෙන්.

**3-173/2**

---

එල්.ඩී.—බී. 130/50

අංක ඩී. 239/වීආර්ජී

## ගුවන් හමුදා පනත

(359 වැනි අධිකාරය වන) ගුවන් හමුදා පනතේ 155 වන වගන්තිය යටතේ ආරක්ෂක හා විදේශ කටයුතු ඇමති විසින් පනවනු ලැබූ නියෝගය.

ඩඩ්ලි සේනානායක,
ආරක්ෂක හා විදේශ කටයුතු ඇමති.

1970 පෙබරවාරි මස 27 දින,
කොළඹ දී ය.

**නියෝගය**

1955 සැප්තැම්බර් මස 16 වැනි දින අංක 10,839 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියෝගයෙන් සංශෝධනය කරන ලද 1951 නොවැම්බර් මස 30 වැනි දින අංක 10,325 දරන ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ, 1951 රාජකීය ලංකා ගුවන් හමුදා (විදේශීය) අභ්‍යාස නියෝගවල 6 වැනි නියෝගය පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමෙන් ඒ නියෝග මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි (2) වැනි ඡෙදයෙහි "රාජෝත්තමයාණන් වහන්සේගේ නාවික හමුදාවට හෝ ගුවන් හමුදාවට අයත්" යන වචන වෙනුවට "යම් නාවික හමුදාවකට හෝ ගුවන් හමුදාවකට අයත්" යන වචන ආදේශ කිරීමෙන් ; හා

(2) එහි (4) වැනි ඡෙදයෙහි "එක්සත් රාජධානියේ එවකට බැඳී පවත්වන නාවික, යුද්ධ හා ගුවන් හමුදා නීතිය" යන වචන වෙනුවට "ඒ පුහුණුවීමේ ආයතනය, නැව, ගුවන් යානය හෝ සංක්‍රමණ කඳවුර අයත් රටෙහි නීතිය" යන වචන ආදේශ කිරීමෙන්.

**3-173/3**

ඇල්. ඞී. බී. 7/63

## 1963 අංක 4 දරණ දේශීය ආදායම් පනත

### 16අ වැනි වගන්තිය යටතේ දැන්වීම

1969 අංක 6 දරණ පනතින් සංශෝධිත 1963 අංක 4 දරණ දේශීය ආදායම් පනතේ 16අ වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් ඇමති උක්කු බණ්ඩා වන්නිනායක වන මම මෙහි උපලේඛනයෙක් දක්වෙන එක් එක් ආයතනය එකී වගන්තියේ කාර්යයන් සඳහා පිළිගත් පුණ්‍යායතනයක් යයි මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

ශූ. බී. වන්නිනායක,
මුදල් ඇමති.

1970 පෙබරවාරි මස 26 දින,
කොළඹ දීය.

### උපලේඛනය

1. මානසික අර්ධ ප්‍රකෘති වශයෙන් යුත් ළමයින් සඳහා පාසැලේ ශුභසාධක සමිතිය
2. ලංකා ලාදුරු සංගමය

3-58

---

## වෘෂී 1958 අංක 15 දරණ සේවක අර්ථ සාධක අරමුදල් ආඥාපනත

### ආයාචනා විනිශ්චය සභාව

වෘෂී 1958 ඔක්තෝබර් මස 31 වැනි දින අංක 11,573 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද වෘෂී 1958 සේවක අර්ථ සාධක අරමුදල් රෙගුලාසි මාලාවේ 47 වැනි රෙගුලාසියෙන් කම්කරු හා රැකීරක්ෂා කටයුතු පිළිබඳ ඇමැතිතුමා වෙත පැවරුණු බලය පිට, මොහමඩ් හනිපා මොහමඩ් වන මම—

(ඒ) මෙයට යාවෙන උපලේඛනයෙහි නියමිත පුද්ගලයන් වෘෂී 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් ආඥාපනතේ 29 වැනි වගන්තියෙහි සඳහන් ආයාචනා විනිශ්චය සභාවෙහි සාමාජිකයන් ලෙස 1970 ජනවාරි මාසයේ සිට බල පැවැත්වෙන සේ මෙයින් පත් කරමි තවද,

(බී) ආයාචනා විනිශ්චය සභාවේ සාමාජිකයෙකු වන කර්නල් නොයෙල් ලූස් ජැන්ස්, එහි සභාපති වශයෙන් ද මෙයින් නම් කරමි.

එම්. එච්. මොහමඩ්,
කම්කරු හා රැකීරක්ෂා කටයුතු පිළිබඳ ඇමැති.

1970 පෙබරවාරි මස 26 දින,
කොළඹ.

### උපලේඛනය

1. කර්නල් නොයෙල් ලූස් ජැන්ස්.
2. අබ්දුල්ලා මොහමඩ් අමීන්.
3. ඩැනියෙල් කිරුපාසුන් දරම් සුබ්‍රමනියම්.
4. මාතර ආරච්චිගේ දෙන් අමරදාස කරුණාතිලක.
5. ක්ලෝඩ් මෙන්ඩිස්.

3-61

---

ඇල්.ඩී.—බී 138/47

පී.සී.සී. අංකය : ඒ 744/50

## රේගු නිවේදන (පාස්කු වක්‍රය) අංක 69/6 .

### රේගු ආඥාපනත

(235 වෙනි අධිකාරය වන) රේගු ආඥාපනතෙහි 10 වෙනි වගන්තිය යටතේ වූ පහත සඳහන් යෝජනාව 1970 පෙබරවාරි මස 8 වැනි දින පවත්වන ලද ප්‍රසිද්ධ සභා වාරයේ දී නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. ආර්. ද සොයිසා,
මුදල් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්
වෙනුවට.

1970 පෙබරවාරි මස 27 වැනි දින,
කොළඹ දී ය.

### යෝජනාව

මේ යෝජනාව ගැසට් පත්‍රයෙහි නිවේදනය කරනු ලබන දින පටන් ක්‍රියාත්මක වන පරිදි, මෙහි උපලේඛනයෙ I වෙනි තීරයෙහි නිශ්චිතව සඳහන් එක් එක් භාණ්ඩය සම්බන්ධයෙන් ඒ උපලේඛනයෙහි II වෙනි තීරයෙහි අනුරූප සටහනෙහි දක්වා ඇති ගාස්තු ප්‍රමාණය අනුව රේගු ආඥාපනත යටතේ අපනයන තීරු බදු අය කළ යුතු බව හා ගෙවිය යුතු බව (235 වෙනි අධිකාරය වන) රේගු ආඥාපනතේ 10 වෙනි වගන්තිය යටතේ මේ සභාව තීරණය කරයි.

### උපලේඛනය

| I වැනි තීරය<br>භාණ්ඩය | II වැනි තීරය<br>ප්‍රමාණය | රු. ශ. |
|---|---|---|
| ක්ෂණික තේ හා මෙහි පහත විස්තර කැරෙන පැකැට්ටුවල හා තේ පසුම්බිවල අසුරන ලද තේ හැර අනෙකුත් ඕනෑම වර්ගයක තේ සඳහා ... | රාත්තල් සියයකට ... | 39 0 බැගින් |
| පැකැට්ටුවල හා තේ පසුම්බිවල අසුරන ලද තේ ; කඩදාසි හෝ ඇළුමිනියම් පත්‍රවලින් ඇතුළත දවටනයක් ඇතිව අසුරන ලද තේ—<br>(අ) පිටත දවටනයක් හෝ පොලිතින් කවරයක් හා මුද්‍රිත ලේබලයක් සහිතව<br>(ආ) කුඩා බෙලෙක් පෙට්ටියක බහාලන ලද<br>(ඇ) කඩදාසි කාටනයක බහාලන ලද<br>(ඈ) ලී පෙට්ටියක බහාලන ලද<br>(ඉ) පන් පෙට්ටියක බහාලන ලද<br>(ඊ) දෙකෙළවර පමණක් මුද්‍රා සහිත පැකැට්ටුවක බහාලන ලද<br>(උ) (පිටත) කඩදාසියෙන් පැකැට්ටුව සම්පූර්ණ ලෙස ආවරණය නොකරන ලද | රාත්තලකට ... | 0 24 බැගින් |
| කෙළවර මුද්‍ර සහිතව කුඩා බෙලෙක් පෙට්ටියක හෝ පැකැට්ටුවක අසුරන ලද තේ ... ... | රාත්තලකට ... | 0 24 බැගින් |
| ආස්තරණය කළ ඇළුමිනියම් පත්‍රයක එනම්, කඩදාසිය ඇළුමිනියම් පත්‍රයෙන් වෙන්ව තිබෙනු වෙනුවට කඩදාසිය එම පත්‍රයටම අලවන ලදුව අසුරන ලද තේ ... | රාත්තලකට ... | 0 24 බැගින් |
| ''ලංකාවේ අසුරන ලද පිරිසිදු ලංකා තේ'' යන වචන හෝ ප්‍රධාන රේගු අයකැමිගේ අදහස පරිදි මේ අර්ථයම ගෙන දෙන වෙනත් වචන බෙලෙක් පෙට්ටියේ හෝ කාට්නයේ හෝ පිට කවරයේ පැහැදිලිව සඳහන් කළ යුතු ය. | | |
| පැකැට්ටුවක තිබිය යුතු තේ ප්‍රමාණයෙහි ශුද්ධ බර රා. 2.20ක් හෝ කිලෝග්‍රෑම් 1කට වැඩි නොවිය යුතුය. | | |
| පසුම්බිය ජලයෙහි ගිල්වා පානය සඳහා සකස් කර ගන්නා තේ සහිත පෙරන කඩදාසි හෝ පෙරන රෙදි පසුම්බිවල අසුරන ලද තේ ... ... | රාත්තලකට ... | 0 24 බැගින් |
| තේ පසුම්බිය පිට කවරයක බහාලන ලද නම් එම කවරයේ ''ලංකාවේ අසුරන ලද පිරිසිදු ලංකා තේ'' යන වචන හෝ ප්‍රධාන රේගු අයකැමිගේ අදහස පරිදි මේ අර්ථයම ගෙන දෙන වෙනත් වචන පැහැදිලිව සඳහන් කළ යුතුය. | | |
| තේ පසුම්බි කාටනයක බහා ඇති නම් එම කාටනයේ ඇති පසුම්බි ගණන සහ එක් එක් පසුම්බියේ ඇති තේ ප්‍රමාණයේ ශුද්ධ බර කාටනයේ පිටත සඳහන් කළ යුතු ය. | | |
| තේ පසුම්බියක තිබිය යුතු තේ ප්‍රමාණයේ සුද්ධ බර අවුන්ස 12 කට හෝ ග්‍රෑම් 240 කට වැඩි නොවිය යුතු ය. | | |

3–59

## උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනත

### 5 වෙනි වගන්තිය යටතේ නිවේදනය

(110 වැනි අධිකාරය වන) උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 5 වෙනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ස්වදේශ කටයුතු භාර ඇමති, විජයානන්ද දහනායක වන මම, 1935 සැප්තැම්බර් මස 20 වෙනි දින අංක 8,146 දරන ගැසට් පත්‍රයේ අතිරේකයෙහි පළ කරනු ලැබ, පසුව සංශෝධනය කරන ලද නිවේදනය එයට යාකොට ඇති උපලේඛනයේ " දකුණු පළාත—ගාල්ල දිස්ත්‍රික්කය " යන ශීර්ෂය යටතේ—

(1) වලවේ කොට්ඨාශයට අදාළ වන අංක 44 දරන විෂය වෙනුවට මෙහි අ උපලේඛනයෙහි සඳහන් විෂය ආදේශ කිරීමෙන්, හා

(2) අංක 44 දරන විෂයට ඉක්බිතිව මෙහි ආ උපලේඛනයෙහි සඳහන් අංක 45 දරන අළුත් විෂය ඇතුලත් කිරීමෙන්,

1970 අප්‍රේල් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම නිවේදනයෙන් සංශෝධනය කරමි.

වි. දහනායක,
ස්වදේශ කටයුතු භාර ඇමති.

1970 පෙබරවාරි 18 දින,
කොළඹ දිය.

### අ උපලේඛනය

44. පහත සඳහන් ග්‍රාමයන්ගෙන් සමන්විත " වලවේ " කොට්ඨාශය :—

කරාගොඩ
තබඳව
පොල්පාගොඩ
මාගෙදර
යටමලගල
වල්පොල
වෙලන්දාව
හිරිඹුරුව

### ආ උපලේඛනය

45. පහත සඳහන් ග්‍රාමයන්ගෙන් සමන්විත " කොට්ටව " කොට්ඨාශය :—

උඩමලගල
උඩුබැට්ටව
කොට්ටව
නාකියාදෙනිය
තල්ගම්පොල
තෙල්ලඹුරේ
බෙරනගොඩ

3-111

---

එල්.ඞී.—බී. 277/40

## පුරාවස්තු ආඥාපනත

1959 අංක 4 දරන පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩුක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් පනවනු ලැබ 1966 අගෝස්තු 9 වෙනි දින අංක 14,707/11 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබූ නිවේදනය සමඟ කියවිය යුතු (188 වෙනි අධිකාරය වන) පුරාවස්තු ආඥාපනතේ 19 වෙනි වගන්තිය යටතේ අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්වරයා විසින් කරනු ලබන දැන්වීමයි.

GAMANI JAYASURIYA,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ
ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1969. 12. 27 වන දින,
කොළඹදීය.

### දැන්වීම

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර මැද පළාත කෝරළයේ දන්තුරේ නමැති ගමේ අයි/25, 1 ඒ දරන දම්වැල් 16 ජේඛා සටහනේ 17 වෙනි සතරස් කොටුවට අසුවන ඉඩමේ පිහිටි දන්තුරේ පුරාණ විහාර භූමිභාගය ඇතුලත පිහිටි පුරාණ ටැම්පිට විහාරගෙය (188 වෙනි අධිකාරය වන) පුරාවස්තු ආඥාපනතේ කාර්‍යයන් සඳහා ආරක්ෂිත ස්මාරකයක් විය යුතු බව ප්‍රකාශ කරමින් එකී ආඥාපනතේ 18 වෙනි වගන්තියේ විධිවිධාන යටතේ ආඥාවක් පැනවීමට අදහස් කරනු ලැබේ.

යථොක්ත ආඥාව පැනවීම ගැන විරුද්ධතා 1970.4.15 වෙනිදා හෝ ඊට පෙර කොළඹ පුරාවිද්‍යා කොමසාරිස් වෙත ලැබෙන ලෙස එවිය යුතුය. එවැනි සෑම විරුද්ධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර, එවැනි විරුද්ධතාවයක් ඉදිරිපත් කරනු ලබන්නේ කවර හේතුන් උඩ යන වග දැක්වෙන ප්‍රකාශයක්ද ඊට ඇතුළත් විය යුතුය.

3-103

---

එල්.ඞී.—බී. 277/40

## පුරාවස්තු ආඥාපනත

1959 අංක 4 දරන පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩුක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් පනවනු ලැබ 1966 අගෝස්තු 9 වෙනි දින අංක 14,707/11 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබූ නිවේදනය සමඟ කියවිය යුතු (188 වෙනි අධිකාරය වන) පුරාවස්තු ආඥාපනතේ 19 වෙනි වගන්තිය යටතේ අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්වරයා විසින් කරනු ලබන දැන්වීමයි.

GAMANI JAYASURIYA,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ
ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1969. 12. 27 වන දින,
කොළඹදීය.

### දැන්වීම

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟ ඉහළ කෝරළයේ කුරුකුදේ නමැති ගමේ අංක 97,855 දරන හිමිකම් පිඹුරු පත්‍රයට අසුවන ඉඩමේ පිහිටි නියම්ගම්පාය රජමහා විහාරගෙයි ඇති පැරණි ගල්කැටයම් හා ගල් උළුවස්ස, (188 වෙනි අධිකාරය වන) පුරාවස්තු ආඥාපනතේ කාර්‍යයන් සඳහා ආරක්ෂිත ස්මාරක විය යුතු බව ප්‍රකාශ කරමින්, එකී ආඥාපනතේ 18 වෙනි වගන්තියේ විධිවිධාන යටතේ ආඥාවක් පැනවීමට අදහස් කරනු ලැබේ.

යථොක්ත ආඥාව පැනවීම ගැන විරුද්ධතා 1970 අප්‍රේල් 30 වෙනිදා හෝ ඊට පෙර කොළඹ පුරාවිද්‍යා කොමසාරිස් වෙත ලැබෙන ලෙස එවිය යුතුය. එවැනි සෑම විරුද්ධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර, එවැනි විරුද්ධතාවයක් ඉදිරිපත් කරනු ලබන්නේ කවර හේතුන් උඩ යන වග දක්වෙන ප්‍රකාශයක්ද ඊට ඇතුළත් විය යුතුය.

3-96

---

ඇල්.ඩී—බී. 277/40

## පුරාවස්තු ආඥාපනත

1959 අංක 4 දරන පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩුක්‍රම) රාජසභා ආඥාවේ 47(2) වන වගන්තිය යටතේ අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් පනවනු ලැබ 1966 අගෝස්තු 9 වෙනි දින අංක 14,707/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ නිවේදනය සමඟ කියවිය යුතු (188 වෙනි අධිකාරය වන) පුරාවස්තු ආඥාපනතේ 18 වෙනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්වරයා විසින් පනවනු ලැබූ ආඥාවයි.

GAMANI JAYASURIYA,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ
ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1969.12.27 දින,
කොළඹදී ය.

### ආඥාව

මෙයට යාකොට ඇති උපලේඛනයේ නිශ්චිතව සඳහන් පුරාණ ස්මාරක (188 වෙනි අධිකාරය වන) පුරාවස්තු ආඥාපනතේ කාර්‍ය යන් සඳහා ආරක්ෂිත ස්මාරක වශයෙන් මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

### උපලේඛනය

(1) මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහා නගර සීමාව තුළ පිහිටි අංක 25/13 දරන පිඹුරු පත්‍රයේ 201 වෙනි කීම් කැබැල්ලට අසුවන ඉඩමේ පිහිටි අස්ගිරියේ ගෙඩිගේ විහාරය යනුවෙන් හැඳින්වෙන පුරාණ විහාර ගෙය.

(2) දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ තෙල්වත්ත නමැති ගමේ තොටගමු විහාරය නොහොත් රත්පත් විහාර භූමිභාගය ඇතුලත පිහිටි නාථදේවාලය යනුවෙන් හැඳින්වෙන පුරාණ දේවාලය.

(3) වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදිහත් පත්තුවේ, ගිරාතලාන කෝරළයේ අඹගහවැව නමැති ගමේ අංක 1708 දරන අවසාන ගම් පිඹුරු පත්‍රයේ 28 වෙනි බිම් කැබැල්ලට අසුවන ඉඩමේ පිහිටි පඩුවස් නුවර රජමහා විහාර භූමිභාගය ඇතුළත පිහිටි " දළදා මාළිගාව " යනුවෙන් හැඳින්වෙන පුරාණ ගොඩනැගිල්ල.

3-201

---

## නොතාරිස් ආඥාපනත (107 අධිකාරය)

කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් ක්‍රිස්ටෝපර් විජිත ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතාට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ද නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් අවසර දී තිබේ.

ඇ. ඒ. ගොගර්ලි මොරගොඩ,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 මාර්තු මස 2 වැනි දින,
කොළඹදී ය.

3-200

---

## නොතාරිස් ආඥාපනත (107 අධිකාරය)

කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් තුරෙයිසිංහම් ජේයරාජසිංහම් මහතාට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත දෙමළ භාෂාවෙන් ද නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් අවසර දී තිබේ.

ඇ. ඒ. ගොගර්ලි මොරගොඩ,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 මාර්තු මස 2 වැනි දින,
කොළඹදී ය.

3-199

---

## නොතාරිස් ආඥාපනත (107 අධිකාරය)

කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් සිඩ්නි විමලසූරිය මහතාට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ද නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් අවසර දී තිබේ.

ඇ. ඒ. ගොගර්ලි මොරගොඩ,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

197C මාර්තු මස 2 වැනි දින,
කොළඹදී ය.

3-195

---

## නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

බලපිටිය අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් කෝරුවගේ ධර්මසිරි ප්‍රනාන්දු මහතාට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ද නොතාරිස් කෙනකු වශයෙන් කටයුතු කිරීමට ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් අවසර දී තිබේ.

ඇ. ඒ. ගොගර්ලි මොරගොඩ,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 පෙබරවාරි මස 24 වැනි දින,
කොළඹදී ය.

3-54

## නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

යාපනය අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් ඇන්තනිපිල්ලේ මාරියම්පිල්ලේ මහතාට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත දෙමළ භාෂාවෙන් ද නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් අවසර දී තිබේ.

ඇ. ඒ. ගොගර්ලි මොරගොඩ,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 පෙබරවාරි මස 24 වැනි දින,
කොළඹදී ය.

3-52

---

## නොතාරිස් ආඥාපනත (107 අධිකාරය)

කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් දියගු බදුරගේ ඩැනී ද සිල්වා මහතාට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ද නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් අවසර දී තිබේ.

ඇ. ඒ. ගොගර්ලි මොරගොඩ,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 පෙබරවාරි මස 24 වැනි දින,
කොළඹදී ය.

3-53

---

## පාර්ලිමේන්තු කාර්ය මණ්ඩල පනත

### නිවේදනයයි

පාර්ලිමේන්තු කාර්‍ය්‍ය මණ්ඩල පනතේ (384 වැනි අධිකාරය) 9 වැනි ඡේදය යටතේ මුදල් ඇමතිතුමාගේ එකඟත්වය ඇතිව, සෙනෙට් සභා කාර්‍ය්‍ය සම්පාදකගේ කාර්‍ය්‍ය මණ්ඩලයට අයත් මෙහි පහත සඳහන් තනතුර 1969 ඔක්තෝබර් මස 1 වැනි දින සිට විශ්‍රාම වැටුප් හිමි ලෙස ප්‍රසිද්ධ කරමි :—

හැන්සාඩ් සංස්කාරක

ඒ. රත්නායක,
සෙනෙට් සභාපති.

1970 ජනවාරි මස 18 වැනි දින.

3-171

---

අංකය : 543ඊ/141 ඞී (VII කොටස).

මෙයට ඇතුළත් උපලේඛනයෙහි II වැනි තීරයෙහි නියමිත දෙපාර්තමේන්තුවෙහි එයට අනුරූපව I වැනි තීරයෙහි නියමිත එක් එක් තනතුර දරන සෑම තැනැත්තෙකුම ඒ තනතුරට පත්කරනු ලැබූ දින සිට විශ්‍රාම වැටුප් ලැබීමට සුදුසුකම් ඇත්තෙකු බව විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 2 වැනි වගන්තිය ප්‍රකාර සහ එම ව්‍යවස්ථාවල විධිවිධානයන්ට යටත්ව දන්වනු ලැබේ.

ඇම්. රාජේන්ද්‍ර,
භාණ්ඩාගාරයේ ලේකම්.

1970 පෙබරවාරි 25 වැනි දින,
කොළඹ මහා භාණ්ඩාගාරයේ දීය.

### උපලේඛනය

| I වැනි තීරය | II වැනි තීරය |
|---|---|
| ගොවිපල අධිකාරි ... | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව. |
| පිඹුරු මුද්‍රණකරු (1968.7.1 දින සිට) | අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය. |
| ප්‍රධාන ගමනා ගමන පිරිවැය නිලධාරි | ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව. |
| ගමනාගමන පිරිවැය නිලධාරි | ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව. |
| වෙළඳ කළමනාකරු | ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව. |
| අලෙවි කිරීමේ සහකාර | ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව. |
| වෙළඳ නියෝජිත | ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව. |
| පුස්තකාලයාධිපති (සංවිධාන සහ ක්‍රම අංශය) | මහා භාණ්ඩාගාරය. |

3-130

එල්.ඩී.—බී. 129/47.

අංක : සී. 39/7/66.

## 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජ සභා ආඥාව

### 61 වන වගන්තිය යටතේ ආඥාව

1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජ සභා ආඥාවේ 61 වන වගන්තිය යටතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවන ලද ආඥාව.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 මාර්තු මස 1 වැනි දින,
කොළඹ දිය.

### අංක 193 දරන ආඥාව

1. මෙහි උපලේඛනයෙහි I වැනි තීරයෙහි නිශ්චිත බලතල ඒ උප ලේඛනයෙහි II වැනි තීරයේ අනුරූප සටහනෙහි නිශ්චිත කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරියාට හෝ නිලධාරීන්ට පහත සඳහන් කොන්දේසිවලට යටත්ව මෙයින් පවරනු ලැබේ :—

(අ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල නිකුත් කළ හැකි උපදෙස් අනුව ඒ බලතල ක්‍රියාවේ යෙදවිය යුතු ය.

(ආ) කෘෂිකර්ම අධ්‍යක්ෂ හැර එසේ බලතල පවරනු ලැබූ නිලධාරියකු විසින් මේ ආඥාව යටතේ තමාට පැවරී ඇති යම් බලයක් යටතේ කරන ලද තීරණය ගැන සෑහීමට පත් නොවූ යම් තැනැත්තකු වේ නම් ඔහු විසින් කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත ආයාචනා කළ හැකි ය.

(ඇ) මේ ආඥාව යටතේ දඬුවම් දීම සම්බන්ධයෙන් යම් නිලධාරියකුට පවරා ඇති බලතල කිසිවක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පාවිච්චි කළ යුතු යයි ඒ කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන යම් අවස්ථාවකදී ඒ නිලධාරියා ඒ කරුණ සම්බන්ධයෙන් ස්වකීය බලතල ක්‍රියාවේ නොයෙදවිය යුතු ය.

2. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ආයාචනා කිරීම සඳහා 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජ සභා ආඥාවේ 61 වැනි වගන්තියෙන් පැවරුණු අයිතිවාසිකම හීන කිරීමක් හෝ ඒ අයිතිවාසිකම කෙරෙහි අන් ලෙසකින් බලපෑමක් හෝ මේ ආඥාවෙහි සඳහන් කිසිවකින් සිදුවෙතැයි නො සැලකිය යුතු ය. නැතහොත් එලෙස තේරුම් නොගත යුතු ය.

3. 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජ සභා ආඥාවෙහි 61 වැනි වගන්තිය යටතේ පනවනු ලැබ, 1955 ඔක්තෝබර් මස 7 වැනි දින හා අංක 10,847 දරන ගැසට් පත්‍රයෙහි පළ වූ අංක 83 දරන ආඥාවෙහි කුමක් සඳහන් වුවද, ඒ නොසලකා මේ ආඥාව බලපැවැත්විය යුතුය.

4. 1958 අගෝස්තු මස 1 වැනි දින අංක 11,465 දරන ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ හා තදනන්තරව සංශෝධනය කරනු ලැබූ අංක 112 දරන ආඥාව, එහි උපලේඛනයෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් වූ කරුණු අතහැරීමෙන් තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

### උපලේඛනය

| | I වැනි තීරය | II වැනි තීරය |
|---|---|---|
| 1. | ආරම්භක වාර්ෂික වැටුප රු. 4,080 ට අඩු වූ තනතුරු සඳහා (ස්ථිර හෝ තාවකාලික) පත්වීම් (ඒකාබද්ධ සේවයන්ට අයත් තනතුරුවලින් අන්‍ය වූ දීමේ බලය. | කෘෂිකර්ම අධ්‍යක්ෂ<br>නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (පාලන) |
| 2. | (ඒකාබද්ධ සේවයන්ට අයත් තනතුරුවලින් අන්‍ය වූ) විශ්‍රාම වැටුප් හිමි වාර්ෂික වැටුප රු. 2,700 ට නොවැඩි හෝ විශ්‍රාම වැටුප්වලට අහිමි වාර්ෂික වැටුප රු. 3,180 ට නොවැඩි හෝ තනතුරු දරන නිලධාරීන්ට, අධිකරණයෙන් වරදකරුවන් කිරීමේ හේතුව හැර, අන් කිසි හේතුවක් යටතේ වූ විෂමාචාරය නිසා සේවයෙන් අස්කිරීමේ හෝ අන්‍යාකාරයකින් දඬුවම් කිරීමේ බලය. | කෘෂිකර්ම අධ්‍යක්ෂ<br>නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (පාලන) |
| 3. | විශ්‍රාම වැටුප් හිමි වාර්ෂික වැටුප රු. 2,700 ට නොවැඩි හෝ විශ්‍රාම වැටුප්වලට අහිමි වාර්ෂික වැටුප රු. 3,180 ට නොවැඩි වූ හෝ තනතුරු දරන නිලධාරීන්ට, අධිකරණයෙන් වරදකරුවන් වීමේ හේතුව හැර අන්කිසි හේතුවක් උඩ තරවටු කිරීමේ, තදින් තරවටු කිරීමේ, සතියක වැටුපට නොවැඩි දඩයක් නියම කිරීමේ, අවුරුද්දකට නොවැඩි කාලයක් පඩි වැඩිවීම තාවකාලිකව අත්හිටුවීමේ, නැවැත්වීමේ, අඩු කිරීමේ නැතහොත් පමා කිරීමේ බලය. | කෘෂිකර්ම අධ්‍යක්ෂ<br>නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (පාලන) |
| 4. | විශ්‍රාම වැටුප් සහිත වාර්ෂික වැටුප රු. 2,700 ට වැඩි එහෙත් පවුම් 690 ට හෝ රු. 9,360 ට නොවැඩි වූ හෝ විශ්‍රාම වැටුප් රහිත වාර්ෂික වැටුප රු. 3,180 ට වැඩි එහෙත් පවුම් 690 ට හෝ රු. 9,360 ට නොවැඩි තනතුරු දරන්නා වූ (ලංකා පරිපාලන සේවයට අයත් තනතුරුවලින් අන්‍ය වූ) නිලධාරියකුට තරවටු කිරීමේ නැතහොත් තදින් තරවටු කිරීමේ, සතියක වැටුපට නොවැඩි දඩයක් පැනවීමේ, අවුරුද්දකට නොවැඩි කාලයක් පඩි වැඩිවීම තාවකාලිකව අත්හිටුවීමේ, නැවැත්වීමේ, අඩු කිරීමේ නැතහොත් පමා කිරීමේ බලය. | කෘෂිකර්ම අධ්‍යක්ෂ<br>නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (පාලන) |
| 5. | විශ්‍රාම වැටුප් සහිත වාර්ෂික වැටුප රු. 2,700 ට නොවැඩි වූ හෝ විශ්‍රාම වැටුප් රහිත වාර්ෂික වැටුප රු. 3,180 ට නොවැඩි වූ හෝ (ඒකාබද්ධ සේවයන්ට අයත් තනතුරු වලින් අන්‍යවූ) තනතුරු දරන නිලධාරියකුට තරවටු කිරීමේ හෝ තදින් තරවටු කිරීමේ හෝ සතියක වැටුපට නොවැඩි දඩයක් පැනවීමේ බලය. | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂවරු<br>ප්‍රධාන ගණකාධිකාරී<br>සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂවරු<br>අධිකාරී ඉංජිනේරුවරු<br>ප්‍රධාන ඉංජිනේරු<br>පරිපාලන නිලධාරීන්<br>කෘෂිකර්ම නිලධාරීන්<br>පර්යේෂණ නිලධාරීන්<br>ගණකාධිකාරීන්<br>උද්භිද උද්‍යාන අධිකාරී<br>සත්ව ගොවිපල්වල සාමාන්‍ය අධිකාරීන්<br>රසාඥ<br>උද්භිද රෝග නිධානඥ<br>කීට විද්‍යාඥ<br>පස සංරක්ෂණ නිලධාරීන්<br>දුම්කොළ නිලධාරීන්<br>කෘෂිකර්ම නිලධාරී (දුම් කොළ)<br>පශු පර්යේෂණ නිලධාරීන්<br>සතුන් භාර නිලධාරීන්<br>කෘෂිකර්ම ඉංජිනේරුවරු<br>සහකාර උද්භිද උද්‍යාණ අධිකාරී<br>සහකාර උද්භිද විද්‍යාඥ<br>සහකාර රසාඥ<br>උද්භිද උද්‍යාන ආරක්ෂකවරුන්<br>කායශිල්ප සහකාර<br>ප්‍රධාන ලිපිකරු<br>යාන්ත්‍රික අධිකාරීන්<br>පශු වෛද්‍යවරුන්<br>සත්ව ගොවිපල්වල සහකාර සාමාන්‍යාධිකාරීන්<br>කෘත්‍රිම සිංචන නිලධාරී<br>එන්නත් සාර නිෂ්පාදන අධිකාරී<br>කර්මාන්තශාලාධිපතිවරුන් (වර්ෂයකට රු. 5,160—360—8,400 වැටුප් පරිමාණය ලබන)<br>සාමාන්‍ය ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පන්තියේ විශේෂ ශ්‍රේණියේ හා I වැනි ශ්‍රේණියේ නිලධාරීන්<br>විශේෂ ශ්‍රේණියේ හා I වැනි ශ්‍රේණියේ කෘෂිකර්ම උපදේශකයන් |

මෙම උපලේඛනයේ '' ඒකාබද්ධ සේවා '' යන්නෙන් ගණකාධිකාරී සේවය, සාමාන්‍ය ලිපිකරු සේවය, යතුරු ලේඛක සේවය, ස්ථාන මාරු සහිත ලඝු ලේඛක සේවය, සරප් සේවය හා පරිවර්තක සේවය අදහස් වේ.

3–117

ඇල්.ඩී.බී.—17/60

## සාප්පු සහ කාර්යාල සේවකයින් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත

### 29 (3) වැනි වගන්තිය යටතේ නිවේදනය

පහත සඳහන් තීරණයේ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් සෑම පෙට්‍රල් පිරවුමේ මධ්‍යස්ථානයක හෝ එම ව්‍යාපාරය සම්බන්ධයෙන් හෝ සේවයේ යොදවා ගනු ලැබ සිටින තැනැත්තන්ට අදාලව, (129 වැනි අධිකාරය වන) සාප්පු සහ කාර්යාල සේවකයින් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනතේ 28 වැනි වගන්තිය යටතේ වේතන විනිශ්චය මණ්ඩලය විසින් කරනු ලැබූ හා අනුමත කරනු ලැබූ එම තීරණය, කම්කරු හා රැකීරක්ෂා කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් ස්ථිර කරන ලද බව එම පනතේ 29 (3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජී. පී. තම්බයියා,
කම්කරු හා රැකීරක්ෂා කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 මාර්තු මස 3 වන දින,
කොළඹ.

### තීරණය

මෙම තීරණය, මෙහි ඇති උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් පෙට්‍රල් පිරවුමේ මධ්‍යස්ථානවල හෝ ඒවායේ ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් හෝ සේවයේ යොදවා ඇති මෙහි පහත සඳහන් වර්ගවල සේවකයින් සඳහා අදාළ විය යුතුය :—

(1) කළමනාකරු,
(2) ගබඩාකරු හා මුදල් භාරකරු,
(3) සහකාර ගබඩාකරු හා මුදල් භාරකරු,
(4) ලිපිකරු,
(5) පොම්පකරු,
(6) කම්කරු.

2. පළමුවෙනි ඡේදයේ සඳහන් යම් පෙට්‍රල් පිරවුමේ මධ්‍යස්ථානයක හෝ ඒ හා අදාල ව්‍යාපාරයෙහි හෝ සේවයෙහි යොදවා ඇති යම් තැනැත්තකුට ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය පහත සඳහන් ආකාරයට විය යුතුය :—

| සේවක පංතිය | | මාසික අවම වේතන ප්‍රමාණය රු. ශ. |
|---|---|---|
| කළමනාකරු | ... ... | 350 00 |
| ගබඩාකරු හා මුදල් භාරකරු | ... | 300 00 |
| සහකාර ගබඩාකරු හා මුදල් භාරකරු | ... | 225 00 |
| ලිපිකරු | ... ... | 155 00 |
| පොම්පකරු | ... ... | 130 00 |
| කම්කරු | .. ... ... | 105 00 |

3. මෙම තීරණය සඳහා—

කළමනාකරු යනුවෙන් පෙට්‍රල් පිරවුමේ මධ්‍යස්ථානය මුළුමනින්ම භාරව සිටින තැනැත්තා අදහස් වෙයි.

ගබඩාකරු හා මුදල් භාරකරු යනුවෙන් බඩු සහ මුදල් සියල්ලම භාරව සිටින තැනැත්තා අදහස් වෙයි.

සහකාර ගබඩාකරු හා මුදල් භාරකරු යනුවෙන් ගබඩාකරු හා මුදල් භාරකරුගේ වැඩට සහාය වන තැනැත්තා අදහස් වෙයි.

ලිපිකරු යනුවෙන් යතුරු ලියනය සහ ගණන් වැඩ ඇතුළු සම්පූර්ණයෙන්ම හෝ ප්‍රධාන වශයෙන් හෝ ලිපිකාර වැඩ කරන තැනැත්තා අදහස් වෙයි.

පොම්පකරු යනුවෙන් පෙට්‍රෝලියම් ද්‍රව්‍ය වාහනවලට දමන, ටයර්වල හුලං පරීක්ෂාකරන, තෙල් ප්‍රමාණය පරීක්ෂා කරන, වාහනයේ වාතාවරණ වීදුරු පිසදමන, නොයෙකුත් මෝටර් උපකරණ විකුණන සහ ගබඩාකරු හා මුදල් භාරකරුට මුදල් භාර දෙන තැනැත්තා අදහස් වෙයි.

කම්කරු යනුවෙන් නුපුහුණු වැඩ කිරීමට යොදන තැනැත්තා අදහස් වෙයි.

### උපලේඛනය

1. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 161, පාර්සන්ස් පාර, කොළඹ 2. වෙළඳාම්කරු—සී. එෆ්. ද මෙල් සහ පුත්‍රයෝ.
2. ලංකා ෆිලින් ස්ටේෂන්, අංක 114, ගාලුපාර, කොළඹ 3. වෙළඳාම්කරු—ස්ටුවර්ට් ඉංජිනියර්ස්.
3. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 596, ගාලු පාර, කොළඹ 3. වෙළඳාම්කරු—ඊ. සී. ඊ. මාර්ටින්.
4. ලංකා ෆිලින් ස්ටේෂන්, අංක 762, ගාලුපාර, කොළඹ 3. වෙළඳාම්කරු—කේ. එම්. වික්‍රමසිංහ.
5. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 323. ගාලු පාර, කොළඹ 3. වෙළඳාම්කරු—ෆිලික්ස් පෙරේරා සහ පුත්‍රයෝ.
6. ලංකා ෆිලින් ස්ටේෂන්, අංක 2, ඇල්ප්‍රඩ් හවුස් ගාර්ඩන්ස්, කොළඹ 3. වෙළඳාම්කරු—සී. දහනායක.
7. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 292, ගාලු පාර, කොළඹ 4. වෙළඳාම්කරු—ඒ. ආර්. ඇම්. කාසිචෙට්ටි.
8. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 245, බම්බලපිටිය පාර, කොළඹ 4. වෙළඳාම්කරු—පී. ආර්. ප්‍රනාන්දු.
9. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 267, ගාලුපාර, කොළඹ 4. වෙළඳාම්කරු—කේ. එම්. වික්‍රමසිංහ.
10. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 279, ගාලුපාර, කොළඹ 4. වෙළඳාම්කරු—ෆ්‍රෙඩ් ජයසිංහ.
11. ලංකා ෆිලින් ස්ටේෂන්, අංක 144, හැව්ලොක් පාර, කොළඹ 5. වෙළඳාම්කරු—සී. එෆ්. ද මෙල් සහ පුත්‍රයෝ.
12. ලංකා සර්විස් ස්ටේෂන් අංක 169, (171), මායා ඇවනිව් කොළඹ 5. වෙළඳාම්කරු—යූ. ඩී. ඒමිස්.
13. ලංකා ෆිලින් ස්ටේෂන්, අංක 42, හැව්ලොක් පාර, කොළඹ 5. වෙළඳාම්කරු—එස්. ද එස්. ජයසිංහ.
14. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 323, හැව්ලොක් පාර, කොළඹ 6. වෙළඳාම්කරු—එස්. ඒ. එම්. මොහිදීන් සහ සමාගම.
15. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 343, ගාලු පාර, කොළඹ 6. වෙළඳාම්කරු—එස්. එම්. වෙල්ගම.
16. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 492, ගාලු පාර, කොළඹ 6. වෙළඳාම්කරු—ඒම්. පී. වික්‍රමසිංහ.
17. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 426, අංක 462, ගාලු පාර, කොළඹ 6. වෙළෙඳාම්කරු—කොළඹ සමුපකාරය.
18. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 37, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 7. වෙළඳාම්කරු—වයි. එම්. බී. රත්නායක.
19. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 25, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 7. වෙළඳාම්කරු—එස්. ද එස්. ජයසිංහ.
20. ලංකා ෆිලින් ස්ටේෂන්, අංක 30, ඇල්බට් ක්‍රෙසන්ට්, කොළඹ 7 වෙළඳම්කරු—එල්. ආර්. කරුණාතිලක.
21. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 75, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 7. වෙළඳාම්කරු—ෆිලික්ස් පෙරේරා සහ පුත්‍රයෝ.
22. ලංකා ෆිලින් ස්ටේෂන්, අංක 10, ග්‍රීන් පාත්, කොළඹ 7. වෙළඳාම්කරු—වී. සී. ප්‍රනාන්දු.
23. ලංකා ෆිලින් ස්ටේෂන්, අංක 41, ඩී. එස්. සේනානායක මාවත, කොළඹ 8. වෙළඳාම්කරු—ඊ. ඒ. පී. එදිරිසිංහ.
24. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 94, ඩී. එස්. සේනානායක මාවත, කොළඹ 8. වෙළඳාම්කරු—ඒ. ඊ. වොන් ඩර්වෝල් සහ සමාගම.
25. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 825, බේස්ලයින් පාර, කොළඹ 9. වෙළඳාම්කරු—සීමාසහිත කොළඹ සමුපකාර සමිති සංගමය.
26. ලංකා ෆිලින් ස්ටේෂන්, අංක 693, බේස්ලයින් පාර, කොළඹ 9. වෙළඳාම්කරු—ඊ. ඒ. පී. එදිරිසිංහ.
27. ලංකා ෆිලින් ස්ටේෂන්, අංක 291, සිරි සංඝරාජ මාවත, කොළඹ 10. වෙළඳාම්කරු—එස්. කනපතිචෙට්ටි.
28. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 650, දෙවෙනි මරදාන, කොළඹ 10. වෙළඳාම්කරු—සීමාසහිත කොළඹ සමුපකාර සමිති සංගමය.
29. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 680, දෙවෙනි මරදාන, කොළඹ 10. වෙළඳාම්කරු එච්. ජී. බී. විජේසිරිවර්ධන.
30. ලංකා ෆිලින් ස්ටේෂන්, අංක 319, සිරි සංඝරාජ මාවත, කොළඹ 10. වෙළඳාම්කරු—වීරකෝන් සහෝදරයෝ.
31. ලංකා ෆිලින් ස්ටේෂන්, අංක 515, ටී. බී. ජයා පාර, කොළඹ 10. වෙළඳාම්කරු—ඊස්ටන් මෝටර් ගරාජ්.
32. ලංකා ෆිලින් ස්ටේෂන්, අංක 4 බී/2, නිව් රෙක්ලමේෂන් පාර, කොළඹ 11. වෙළඳාම්කරු—සිලෝන් ෂිපින් ලයින්ස්.
33. ලංකා ෆිලින් ස්ටේෂන්, අංක 341, නොරිස් පාර, කොළඹ 11. වෙළඳාම්කරු—ගිල්බට් සහ පිටඩ්.
34. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 29, කයිසර් වීදිය, කොළඹ 11. වෙළඳාම්කරු—බී. තෝමස්සිංඤෝ.
35. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 253, ජෝර්ජ් ආර්. ද සිල්වා මාවත, කොළඹ 13. වෙළඳාම්කරු—ඊ. එස්. ප්‍රනාන්දු.
36. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 353, ජෝර්ජ් ආර්. ද සිල්වා මාවත, කොළඹ 13. වෙළඳාම්කරු—සීමාසහිත කොළඹ සමුපකාර සමිති සංගමය.

37. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 125, ජෝර්ජ් ආර්. ද සිල්වා මාවත, කොළඹ 13.
වෙළඳාම්කරු—බී. ඩී. එස්. ගුණසේකර.
38. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 271, බේස්ලයින් පාර, කොළඹ 9.
වෙළඳාම්කරු—ඩී. වී. විජේසූරිය.
39. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 291, බේස්ලයින් පාර, කොළඹ 9.
වෙළඳාම්කරු—ඒ. සංඝදාස සිල්වා.
40. ලංකා ෆිලින් ස්ටේෂන්, අංක 115, වොල්ෆෙන්ඩෝල් වීදිය, කොළඹ 13.
වෙළඳාම්කරු—සීමාසහිත කොළඹ සමුපකාර සමිති සංගමය.
41. ලංකා ෆිලින් ස්ටේෂන්, අංක 502, ප්‍රින්ස් ඔෆ් වේල්ස් ඇවනිව්, කොළඹ 14.
වෙළඳාම්කරු—වීරකෝන් සහෝදරයෝ.
42. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 363, 379 ප්‍රින්ස් ඔෆ් වේල්ස් ඇවනිව්, කොළඹ 14.
වෙළඳාම්කරු—එන්. ඩබ්ලිව්. ජයරත්නම්.
43. ලංකා ෆිලින් ස්ටේෂන්, අංක 145, ස්වේස් පාර, කොළඹ 14.
වෙළඳාම්කරු—එල්. ඒ. පෙරේරා.
44. ලංකා ෆිලින් ස්ටේෂන් අංක 19, ජේතවන පාර, කොළඹ 14.
වෙළඳාම්කරු—සී. එෆ්. ද මෙල් සහ පුත්‍රයෝ.
45. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 24, ජේතවන පාර, කොළඹ 14.
වෙළඳාම්කරු—කේ. ගුණරත්නම්, එම්. රාමස්වරම්.
46. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 481ඒ, ප්‍රින්ස් ඔෆ් වේල්ස් ඇවනිව්, කොළඹ 14.
වෙළඳාම්කරු—ජේ. එස්. ඒ. ප්‍රනාන්දු.
47. ලංකා ෆිලින් ස්ටේෂන්, අංක 84, ශාන්ත ඇන්ඩෲස් පාර, කොළඹ 15.
වෙළඳාම්කරු—එම්. ඩබ්ලිව්. ජයරත්න.
48. ලංකා සර්විස් ස්ටේෂන්, ගාලු පාර, කොළඹ 3.
වෙළඳාම්කරු—සීමාසහිත වෝකර් පුත්‍රයෝ සහ සමාගම.
49. ලංකා පිලින් ස්ටේෂන්, ධර්මපාල මාවත, කොළඹ 3.
වෙළඳාම්කරු—සීමාසහිත රෝලන්ඩ්ස්.
50. ලංකා ෆිලින් ස්ටේෂන්, ඇල්ස්ටන් පෙදෙස, කොළඹ 2.
වෙළඳාම්කරු—සීමාසහිත බ්‍රිතිෂ් කාර් සමාගම.
51. ලංකා ෆිලින් ස්ටේෂන්, රජින වීදිය, කොළඹ 1.
වෙළඳාම්කරු—සීමාසහිත බෝගල මෝටර්ස්.
52. ලංකා සර්විස් ස්ටේෂන්, ඩීන්ස් පාර, කොළඹ 10.
වෙළඳාම්කරු—ආර්. එස්. කුක්.
53. ලංකා ෆිලින් ස්ටේෂන්, ප්‍රින්ස් ඔෆ් වේල්ස් ඇවනිව්, කොළඹ 14.
වෙළඳාම්කරු—බ්‍රෝඩ්වේ ඔටෝමෝටිව්ස්.
54. ලංකා ෆිලින් ස්ටේෂන්, ජේතවන පාර, කොළඹ 14.
වෙළඳාම්කරු—සෝමපාල කෝපරේෂන්.
55 ලංකා ෆිලින් ස්ටේෂන්, පාසන්ස් පාර, කොළඹ 2.
වෙළඳාම්කරු—එස්. ඒ. මොහිදීන් සහ සමාගම.
56. ලංකා ෆිලින් ස්ටේෂන්, ජෙනරල් ලේක් පාර, කොළඹ 2.
වෙළඳාම්කරු—ආර්. ජනාකිරාම් සහ සමාගම.
57. ලංකා ෆිලින් ස්ටේෂන්, හයිඩ් පාක් කෝනර්, කොළඹ 2.
වෙළඳාම්කරු—රිචඩ් පීරිස් සහ සමාගම.
58. ලංකා ෆිලින් ස්ටේෂන්, යුනියන් පෙදෙස, කොළඹ 2.
වෙළඳාම්කරු—සීමාසහිත සී එෆ්. ඊ. ඉන්ජිනියරින් වර්ක්ස්.
59. ලංකා ෆිලින් ස්ටේෂන් යුනියන් පෙදෙස, කොළඹ 2.
වෙළඳාම්කරු—සීමාසහිත බ්‍රවුන් සහ සමාගම.

3-180

---

## සමගි මණ්ඩල පනත

### ආඥාව

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47(2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1969 ජනවාරි 13 වන දින අංක 14,836/3 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3(1), 3(8) හා 4(1) වන වගන්ති වලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, මොහමඩ් හනීෆා මොහමමදු නයිනා මරික්කාර් වන මම—

(අ) 1969 ජූලි 4 වැනි දින අංක 14,861 දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3(2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උපලේඛනයෙහි අංක 8 දරණ ස්ථානයෙහි විස්තර කරනු ලැබූ පින්නවල ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි:—

(1) කෑගල්ල, රන්දෙණිය පදිංචි ගාමිනී ක්ලිෆඩ් සුසන්තා රාජපක්ෂ මහතා.
(2) කෑගල්ල, දිඹුල්ගමුව පදිංචි විජේසිංහගෙදර ගුණදාස මහතා.
(3) කෑගල්ල, නිල්වත්ත පදිංචි ලේකම්රාල්ලාගේ ඩිංගිරි අප්පුහාමි මහතා.
(4) කෑගල්ල, කරඹුපන, "සාමය" හි පදිංචි වන්නි ආරච්චිල්ලාගේ උක්කු බණ්ඩා ගුණතිලක මහතා.
(5) හිරිවඩුන්න, "මාදන වලව්ව" හි පදිංචි හිටි බණ්ඩාර මහත්තෝ මුදියන්සෙ රාලහාමිල්ලාගේ ධර්මසේන මාදන මහතා.
(6) හිරිවඩුන්න, දියගම, "සිංහගිරි" හි පදිංචි පෙරුම්බඩ ජේ සිගේ සුගතපාල මහතා.
(7) කෑගල්ල, පුවක්දෙනිය පදිංචි සමරකෝන් මුදියන්සේලාගේ පොඩිරාලහාමි සමරකෝන් මහතා.
(8) හිරිවඩුන්න, රන්දෙනිය පදිංචි හේනකරාල්ලාගේ සමරපාල රන්දෙණිය මහතා.
(9) කෑගල්ල, පුවක්දෙනිය පදිංචි ආතාවුද අච්චිල්ලාගේ පුංචිබණ්ඩා බස්නායක මහතා.
(10) මොලගොඩ, පල්පාතා පදිංචි හුරීමළුවේ නරසිංහ ආරච්චිගේ ගුණරත්න මහතා.
(11) කෑගල්ල, පුවක්දෙනිය, "නිකතැන්න" හි පදිංචි මුදියන්සේ රාලහාමිල්ලාගේ දිසානායක මහතා.
(12) මොලගොඩ, කිවුල්පනේ පදිංචි කෙහෙල්පන්නල රාල්ලාගේ රම්බණ්ඩා මහතා.
රත්න මහතා.
(13) මොලගොඩ, මාගොඩ පදිංචි සමරක්කොඩිගේ කරුණාරත්න මහතා.
(14) කෑගල්ල, දෙටවල පදිංචි අයිරාංගනී වීරකෝ මහත්මිය.
(15) රඹුක්කන, කිරිවන්දෙනිය පදිංචි හේනක රාල්ලාගේ උක්කුරාල මහතා.
(16) හිරිවඩුන්න, හල්පිටිය පදිංචි සිරිසේන බණ්ඩා හිටිහාමු මහතා.
(17) හිරිවඩුන්න, කරඳගස්තැන්න වත්ත, හපුගොඩ පදිංචි රතෝපුර දේවගේ විමල විජේසේන මහතා.
(18) මොලගොඩ, මංගලගම පදිංචි මුහම්දිරම් ගල්උද් දලාගේ කලු අප්පු මංගලගම මහතා.
(19) රඹුක්කන, යෝදගම පදිංචි ජයසිංහ ආරච්චිල්ලාගේ මුදියන්සේ මහතා.
(20) රඹුක්කන, කොටගම පදිංචි රත්නායක මුදියන්සේලාගේ පොඩිරාලහාමි රත්නායක මහතා.
(21) කෑගල්ල, කරඹුපොන, "කාලචම්පා" හි පදිංචි සෝමා රණවීර මහත්මිය.
(22) මොලගොඩ, ගල්පොල පදිංචි හෙට්ටිආරච්චිල්ලාගේ පුංචි බණ්ඩා මහතා.
(23) මොලගොඩ, හැරම්පිපාන පදිංචි මංගලගම ගම්ලත්ලාගේ තිස්ස මංගලගම මහතා.
(24) මොලගොඩ පදිංචි තලුක්කුවේ කංකානමලාගේ චන්ද්‍රා සමරසිංහ මහත්මිය.
(25) මොලගොඩ, වරාගොඩ පදිංචි ජයසිංහ ආරච්චිගේ අශෝක ජයසිංහ මහතා.
(26) මොලගොඩ, පදිංචි බියන්ගම ආරච්චිගේ ආරියදාස පෙරේරා මහතා.
(27) මොලගොඩ, කුඹල්දිවෙල පදිංචි අලහකෝන් මුදියන්සේලාගේ සෑම් ජයසූරිය මහතා.
(28) හිරිවඩුන්න, දුනුකේවෙල, ඇලිපාත පදිංචි වලිසිංහ දේවගේ ජූලිස් මහතා.
(29) කෑගල්ල, ඇලිවල පදිංචි වරකාපිටිය මුදියන්සේලාගේ සෙනෙවිරත්න බණ්ඩා මහතා.
(30) හිරිවඩුන්න, මාදන පදිංචි මහත්තෝ මුදියන්සෙරාලහාමිල්ලාගේ සේනාරත්න බණ්ඩා මාදන මහතා.
(31) රඹුක්කන, බතඹුරේ පදිංචි මුදියන්සේ විමලධර්ම මහතා.
(32) රඹුක්කන, පින්නවල පදිංචි පින්නවල කටුගහයලාගේ ජෝන් මහතා.
(33) හිරිවඩුන්න, රන්දෙනිය පදිංචි පොඩිමැණිකේ මාරලන් ද මහත්මිය.
(34) කෑගල්ල, නිල්වත්ත පදිංචි සේනාරත්න බණ්ඩා බාලසූරිය මහතා.
(35) කෑගල්ල, පුවක්දෙණිය, "අමිතා නිවස" හි පදිංචි ඒකනායක මුදියන්සේලාගේ ටිකිරිබණ්ඩාර විජේකෝන් මහතා.

(ආ) කෑගල්ල, රන්දෙනිය පදිංචි ගාමිනී ක්ලිෆඩ් සුසන්තා රාජපක්ෂ මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

එම්. එච්. එම්. නයිනා මරික්කාර්,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 පෙබරවාරි මස 24 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

3-94

## 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව

### අංක 118—මින්නේරිය මැතිවරණ කොට්ඨාශය

### නිවැරදි කිරීමයි

අංක 118 දරණ මින්නේරිය මැතිවරණ කොට්ඨාශය වෙනුවෙන් 1969 නොවැම්බර් මස 30 වැනි දින අංක 14,879/17 දරණ ලංකාණ්ඩුවේ ගැසට් අතිවිශේෂයේ පළ කරන ලද ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 10 (3) වැනි වගන්තිය යටතේ වූ දැන්වීමේ උපලේඛනය පහත සඳහන් පරිදි නිවැරදි කොට කියවිය යුතුය.

“ ඊ ” — අක්ෂරය දරණ ඡන්ද කොට්ඨාශය සඳහා වූ ඡන්ද කොට්ඨාශ විස්තරයේ, “ සහ මින්නේරිය ගම් සභාවේ අංක 6 දරණ කොට්ඨාශයට ඇතුළත්වූ, (යෝධඇල ගම) ” යන වචන හා ඉලක්කම කපා හරින්න.

“ එෆ් ” — අක්ෂරය දරණ ඡන්ද කොට්ඨාශය සඳහා වූ ඡන්ද කොට්ඨාශ විස්තරයේ, “ අංක 3 සහ 4 ට ” යන වචන වලට හා ඉලක්කම්වලට පසු “ සහ මින්නේරිය ගම් සභාවේ අංක 6 දරණ කොට්ඨාශයේ කොටසකට ඇතුළත් වූ, (යෝධඇල ගම) ” යන වචන හා ඉලක්කම ඇතුළත් කරන්න.

“ අයි ” — අක්ෂරය දරණ ඡන්ද කොට්ඨාශය සඳහා වූ ඡන්ද කොට්ඨාශ විස්තරයේ, “ ඇතුළත් වූ ” යන වචනවලට පසු “ අඹගස්වැව ” යන වචනය ද ඇතුළත් කරන්න.

“ ජේ ” — අක්ෂරය දරණ ඡන්ද කොට්ඨාශය සඳහා වූ ඡන්ද කොට්ඨාශ විස්තරයේ, “ අංක 13 දරණ කොට්ඨාශයට අයත් අඹගස්වැව ගමද ” යන ඉලක්කම් හා වචන ද, “ සහ තලාකොලවැව ” යන වචන ද කපා හැර, “ අංක 11 දරණ කොට්ඨාශයට අයත් ” යන ඉලක්කම් හා වචනවලට පසු, “ අලුත්වැව සහ තලාකොල වැවද ” යන වචන ඇතුළත් කරන්න.

“ ඩබ්ලිව් ” — දරණ ඡන්ද කොට්ඨාශය සඳහා වූ ඡන්ද කොට්ඨාශ විස්තරයේ ඉදිරියෙන් දැක්වෙන ඡන්දය විමසන ස්ථානය හෝ ස්ථාන පිහිටුවනු ලබන ප්‍රදේශය යන තීරය යටතේ දැක්වෙන “ යටියල් පතාන ” යන්න “ යටියල්පතාන කොටසක් ” යනුවෙන් නිවැරදි විය යුතුයි.

“ වයි ” — (i) අක්ෂරය දරණ ඡන්ද කොට්ඨාශය සඳහා වූ ඡන්ද කොට්ඨාශ විස්තරයේ දෙවැනි ජේලියේ “ කොට්ඨාශයට ” යන වචනයේ සිට “ යන ගම් ද ” යන වචන දක්වා සියලුම වචන කපා හැර, “ කොට්ඨාශයේ කොටසකට ඇතුළත්වූ, වෙහෙරඑළිය (කවුඩුල්ල “ බී ” කොටසක්) සහ යටියල්පතාන (කොටසක්) ; අංක 11 දරණ කොට්ඨාශයේ කොටසකට ඇතුළත් වූ වෙහෙරඑළිය (කවුඩුල්ල “ බී ” කොටසක්) යන ගම් ද ” යන වචන හා ඉලක්කම් ඇතුළත් කරන්න.

(ii) ඡන්දය විමසන ස්ථානය හෝ ස්ථාන පිහිටුවනු ලබන ප්‍රදේශය “ කවුඩුල්ල බී ” යන්න “ කවුඩුල්ල බී කොටසක් ” යනුවෙන් නිවැරදි විය යුතුයි.

“ ඉසෙඩ් ” — අක්ෂරය දරණ ඡන්ද කොට්ඨාශය සඳහා වූ ඡන්ද කොට්ඨාශ විස්තරයේ “ අංක 9 ” යන වචන හා ඉලක්කම් කපා හැර, “ අංක 10 ” යන වචනය හා ඉලක්කම් ඇතුළත් කරන්න. එහිම තුන්වැනි ජේලියේ වචන සම්පූර්ණයෙන්ම කපා හැර, “ කොට්ඨාශයේ කොටසකට ඇතුළත්වූ, සංසුන්ගම (කවුඩුල්ල ඊ) සහ රත්කොත්ගම (කවුඩුල්ල “ සී ” කොටසක්) යන ගම් ද වේ ” යන වචන ඇතුළත් කරන්න.

“ ඕඕ ” — දරණ ඡන්ද කොට්ඨාශය සඳහා වූ ඡන්ද කොට්ඨාශ විස්තරයේ ඉදිරියෙන් දැක්වෙන ඡන්දය විමසන ස්ථානය හෝ ස්ථාන පිහිටුවනු ලබන ප්‍රදේශය යන තීරය යටතේ දැක්වෙන “ හිඟුරක්දමන ” යන්න “ හිඟුරක්දමන කොටසක් ” යනුවෙන් නිවැරදි විය යුතුයි.

එන්. යූ. යසපාල,
සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී,
අංක 118—මින්නේරිය මැතිවරණ කොට්ඨාශය.

1969 පෙබරවාරි 20 වැනි දින,
පොලොන්නරුව, මැතිවරණ කාර්යාලයේ දීය.

3-190/1

---

## 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව

### අංක 119—පොලොන්නරුව මැතිවරණ කොට්ඨාශය

### නිවැරදි කිරීමයි

අංක 119 දරණ පොලොන්නරුව මැතිවරණ කොට්ඨාශය වෙනුවෙන් 1969 නොවැම්බර් මස 30 වෙනි දින අංක 14,879/17 දරණ ලංකාණ්ඩුවේ ගැසට් අතිවිශේෂයේ පළ කරන ලද ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 10 (3) වැනි වගන්තිය යටතේ වූ දැන්වීමේ උපලේඛනය පහත සඳහන් පරිදි නිවැරදි කොට කියවිය යුතුය.

“ එන්එන් ” — අක්ෂරය දරණ ඡන්ද කොට්ඨාශයේ ඡන්ද කොට්ඨාශ විස්තරයේ, 2 වෙනි ජේලියේ “ අංක 3 දරණ කොට්ඨාශයට ” යන වචන හා ඉලක්කම කපා හැර, “ අංක 3 දරණ කොට්ඨාශයේ කොටසකට ” යන වචන හා ඉලක්කම ද, තුන්වෙනි ජේලියේ “ අංක 3 දරණ කොට්ඨාශයට ” යන වචන හා ඉලක්කම කපා හැර, “ අංක 3 දරණ කොට්ඨාශයේ කොටසකට ” යන වචන හා ඉලක්කම ද යොදන්න.

“ ඔඔ ” — අක්ෂරය දරණ ඡන්ද කොට්ඨාශයේ ඡන්ද කොට්ඨාශ විස්තරයේ, “ අංක 3 දරණ කොට්ඨාශයට ” යන වචන හා ඉලක්කම කපා හැර, “ අංක 3 දරණ කොට්ඨාශයේ කොටසකට ” යන වචන හා ඉලක්කම යොදන්න.

“ එස්එස් ” — අක්ෂරය දරණ ඡන්ද කොට්ඨාශයේ ඡන්ද කොට්ඨාශ විස්තරයේ, තුන්වෙනි ජේලියේ “ මනම්පිටිය කොටසක් ” යන වචනවලට පසු, “ සහ අංක 16 දරණ කොට්ඨාශයේ කොටසකට ඇතුළත්වූ සීලපුර ” යන වචන හා ඉලක්කම් ඇතුළත් කරන්න.

“ ටීටී ” — අක්ෂරය දරණ ඡන්ද කොට්ඨාශයේ ඡන්ද කොට්ඨාශ විස්තරයේ, “ අංක 16 දරණ කොට්ඨාශයට ඇතුළත්වූ දලුකාන හා සීලපුර ” යන වචන හා ඉලක්කම් කපාහැර, “ අංක 16 දරණ කොට්ඨාශයේ කොටසකට ඇතුළත්වූ දලුකාන ” යන වචන හා ඉලක්කම් ඇතුළත් කරන්න.

“ වීවී ” — අක්ෂරය දරණ ඡන්ද කොට්ඨාශයේ ඡන්ද කොට්ඨාශ විස්තරයේ, “ අංක 20 දරණ කොට්ඨාශයට ” යන වචන හා ඉලක්කම් කපා හැර, “ අංක 20 දරණ කොට්ඨාශයේ කොටසකට ” යන වචන හා ඉලක්කම් යොදන්න.

“ ඩබ්ලිව්ඩබ්ලිව් ” — අක්ෂරය දරණ ඡන්ද කොට්ඨාශයේ ඡන්ද කොට්ඨාශ විස්තරයේ තුන්වෙනි ජේලියේ “ අංක 20 දරණ කොට්ඨාශයට ” යන වචන හා ඉලක්කම් කපා හැර, “ අංක 20 දරණ කොට්ඨාශයේ කොටසකට ” යන වචන හා ඉලක්කම් ඇතුළත් කරන්න.

එන්. යූ. යසපාල,
සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී,
අංක 119—පොලොන්නරුව මැතිවරණ කොට්ඨාශය.

1970 පෙබරවාරි 20 වැනි දින,
පොලොන්නරුව මැතිවරණ කාර්යාලයේ දීය.

3-190/2

ඇල්. සී.—බී. 11/60

## වන්දනා ගමන් ආඥාපනත

(175 වැනි අධිකාරය වන) වන්දනා ගමන් ආඥාපනතේ 2 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ස්වදේශ කටයුතු භාර ඇමතිවරයා විසින් පනවන ලද නියෝග.

වී. දහනායක,
ස්වදේශ කටයුතු භාර ඇමති.

1970 මාර්තු 2 දින,
කොළඹ.

### නියෝග

1. මෙම නියෝග, 1970 දඹුලු විහාරයේ වෙසක් සහ පොසොන් වන්දනා ගමන් පිළිබඳ නියෝග වශයෙන් හැඳින්විය හැක.

2. මෙම නියෝගවල—

"කඳවුරු ප්‍රදේශය" යනුවෙන් මෙහි උපලේඛනයෙහි දක්වා ඇති ප්‍රදේශය අදහස් වේ.

"දිසාපති" යනුවෙන් මාතලේ දිස්ත්‍රික්කයේ දිසාපති අදහස් වේ.

"සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි" යනුවෙන් දඹුල්ලේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි අදහස් වේ.

"සහකාර පොලිස් අධිකාරි" යනුවෙන් මාතලේ සහකාර පොලිස් නිලධාරි අදහස් වේ.

3. මෙම නියෝග දඹුලු විහාරය වන්දනා කරන සෑම වන්දනා ගමනාකටම අදාළ වේ.

4. කඳවුරු ප්‍රදේශය දිසාපතිගේ සාමාන්‍ය පරිපාලනය යටතේ පැවතිය යුතු අතර, සහකාර පොලිස් අධිකාරි සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි ඔහුට මේ කටයුත්තෙහිදී සහය දිය යුතුය. දිසාපති නැති අවස්ථාවලදී දඹුල්ල ප්‍රාදේශීය ආදායම් නිලධාරි ගේ පරිපාලනයට කඳවුරු ප්‍රදේශය යටත් විය යුතුය. මෙම නියෝග යටතේ දිසාපති, සහකාර පොලිස් අධිකාරි හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි සතු බලතල, එම අය නැති අවස්ථාවලදී පිළිවෙලින් දඹුල්ලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරී, කඳවුරේ සිටින ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරි සහ මහජන සෞඛ්‍ය පරීක්ෂක යන නිලධාරීන් විසින් පාවිච්චි කළ හැකි වේ.

5. පහත සඳහන් බලතල දිසාපති සතු විය යුතුය :—

(අ) සේදීම සහ නෑමත්, බීම සහ ගෘහ කටයුතුත් සඳහා ජලය ගැනීමට යම් විශේෂ ස්ථාන වෙන් වශයෙන් වෙන් කිරීම.

(ආ) විවිධ පංතිවලට අයත් වන්දනාකරුවන් සඳහා වෙන වෙනම ස්ථාන නියම කිරීම.

(ඇ) වන්දනාකරුවන්ට දෙනු ලබන සියලුම ආහාර බෙදා හැරීම ක්‍රමවත් කිරීම.

(ඈ) රෝගී වන වන්දනාකරුවන්ගේ වාසය සඳහා ස්ථාන වෙන් කිරීම, ඔවුන් සමග වෙනත් අයගේ සම්බන්ධකම් ක්‍රමවත් කිරීම සහ තහනම් කිරීම, ගමන් කිරීමට නොහැකි තත්ත්වයක සිටින අය නවත්වා ගැනීම.

(ඉ) ගොනුන් සහ කරත්ත, කාර් බස් හා වෙනත් මෝටර් වාහන නතර කිරීමට ස්ථාන වෙන් කිරීම සහ වෙන ස්ථාන ඒ සඳහා පාවිච්චි කිරීම තහනම් කිරීම.

(ඊ) භෝජනශාලා සහ කඩ මඩු සඳහා ද සතුන් සහ කුරුල්ලන් මැරීම සඳහා ද ස්ථාන වෙන් කිරීම සහ ඒ සඳහා අන් ස්ථානයන් පාවිච්චි කිරීම තහනම් කිරීම.

6. තත් කාර්යය සඳහා දිසාපති විසින් වෙන් කළ හෝ අනුමත කළ හෝ ස්ථානයක හැර වෙන අන්කිසි ස්ථානයක කිසිම අයකු මල මූත්‍ර පහ නොකළ යුතුය.

7. කැලි කසළ දැමීම සඳහා දිසාපතිගේ අනුමැතිය ඇතිව වෙන් කරන ලද ස්ථානයක හෝ භාජනයක හෝ මිස, කඳවුරු ප්‍රදේශයේ වෙන තැනක කිසිම අයකු ඝන හෝ ද්‍රව කැලි කසළ කිසිවක් නොදැමිය යුතුය.

8. තත් කාර්යය සඳහා දිසාපතිගෙන් අවසර පත්‍රයක් නොලැබ කිසිම කෙනෙකු විසින් බේකරියක්, සිසිල් බීම කර්මාන්ත ශාලාවක්, තේ හෝ කෝපි කඩයක්, භෝජනාගාරයක් හෝ ශාලක් පිහිටුවීම හෝ පවත්වා ගෙන යාම නොකළ යුතුය.

9. (1) වෙළඳාම සඳහා වෙළඳ ද්‍රව්‍ය තැබීම පිණිස දිසාපති විසින් කඳවුරු ප්‍රදේශය තුළ වෙන් නොකරන ලද ස්ථානයක කිසිම අයකු කිසිම වෙළඳ ද්‍රව්‍යයක් විකිණීම සඳහා නොතැබිය යුතුය.

(2) සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි විසින් අපථ්‍යයැයි ප්‍රකාශයට පත් කරන ලද කිසිම ආහාර ද්‍රව්‍යයක් කිසිම අයකු විසින් නොවිකිණිය යුතුය.

(3) අපථ්‍යයැයි තමා විසින් ප්‍රකාශයට පත් කරන ලද ඕනෑම ආහාරයක් සෞඛ්‍ය නිලධාරි විසින් විනාශ කිරීම නීත්‍යානුකූල විය යුතුය.

10. (1) සියලුම භෝජනාගාර හා කෝපි සහ තේ කඩ පිරිසිදුවද සනීපය රැකෙන අයුරෙන් ද පවත්වා ගෙන යා යුතුය.

(2) විකිණීම සඳහා තබනු ලබන සියලුම කේක් වර්ග, රසකැවිලි වර්ග සහ පිසින ලද වෙනත් ආහාර ද්‍රව්‍ය නිසියාකාරයෙන් තනන ලද මැසි නිවාරණ වීදුරු පෙට්ටිවල තැබිය යුතුය.

(3) ඉවත දමන තේ, කෝපි, කිරි, ඉඳුල් කිසිවක් හෝ ඉවුම් පිහුම්වලදී ඉවත දමන දෑ කිසිවක් හෝ වෙනත් කැලි කසළ හෝ බිම නොදැමිය යුතුය. එවැනි කැලි කසළ සියල්ලක්ම සෞඛ්‍ය නිලධාරීන් විසින් ගෙන යාම සඳහා සෑම විටම සූදානම් කොට, මෙහි මින් මතු නියම කර ඇති ආකාරයේ භාජනවල බහා තැබිය යුතුය.

(4) වෙළඳාමක් හෝ ව්‍යාපාරයක් සඳහා පාවිච්චි කරනු ලබන සෑම ගොඩනැගිල්ලක, නිර්මාණයක හෝ ස්ථානයක ... ලීයෙන් හෝ ලෝහයෙන් සාදන ලද ඝන අඩි $4\frac{1}{2}$ කට නොඅඩු ප්‍රමාණයේ කුණු බාල්දියක් තිබිය යුතු වේ. එම ගොඩනැගිල්ලේ, නිර්මාණයේ හෝ ස්ථානයේ එක්කාසු වන සියලුම කැලි කසළ එම කුණු බාල්දියේ දැමිය යුතු වේ. තවද එම බාල්දියට කසළ දමන හෝ එයින් කසළ ඉවත් කරන අවස්ථාවලදී හැර අන් හැම විටදීම, ලී හෝ ලෝහ පියනකින් එම බාල්දිය වසා තැබිය යුතුය.

11. බෝවෙන රෝගයකින් පෙළෙන කිසිම කෙනෙකු කඳවුරු ප්‍රදේශයට ඇතුළු නොවිය යුතුය.

12. කිසිම කෙනෙකු විසින් බෝවෙන රෝගයකින් පෙළෙන අයකු කඳවුරු ප්‍රදේශයට කැඳවාගෙන ඒම හෝ කඳවුරු ප්‍රදේශයට ඇතුළු වීමට එවැනි අයකුට ආධාර කිරීම හෝ අනුබල දීම හෝ නොකළ යුතුය.

13. උත්සව කාලයෙහි දී කඳවුරු ප්‍රදේශ තුළ කිසියම් වසංගත රෝගයක් පැන නැගුණහොත් කඳවුරු ප්‍රදේශය හැර යන ලෙස වන්දනාකරුවන්ට දිසාපති විසින් විධාන කිරීමත්, කවර මගකින්, කවර වාහනයකින් නොහොත් කවර අයුරකින් වන්දනාකරුවන් පිටව යායුතුදැයි නියම කිරීමත් නීත්‍යානුකූල විය යුතුය.

14. කඳවුරු ප්‍රදේශය ඇතුළත දී බෝවෙන රෝගයක් වැළඳෙන සෑම අයකුද, එබඳු බෝවෙන රෝගයක් වෙනත් අයකුට වැළඳී ඇති බව දැන දැනම එම වෙනත් අය සමග පදිංචිව සිටින සෑම අයකු විසින් ද එම කාරණය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිට දන්වා සිටිය යුතුය.

15. දිසාපතිගෙන් පළමුව අවසරය ලබාගෙන මිස කිසිම අයකු විසින් කඳවුරු ප්‍රදේශය ඇතුළත වීදියක් වශයෙන් පාවිච්චි කරනු ලබන නොහොත් ඒ සඳහා වෙන් කොට ඇති භූමියක් අයුතු ලෙස ඇදෙන පරිදි කඩමඩුවක් සෑදීම හෝ ගොඩනැගිල්ලක් විශාල කිරීම හෝ නොකළ යුතුය.

16. මනුෂ්‍ය ආහාරය සඳහා සතුන් මැරීම හෙවත් ඝාතනය කිරීම පිණිස දිසාපති විසින් අනුමත කරන ලද හෝ විශේෂයෙන් ඒ සඳහාම වෙන් කරන ලද ස්ථානවල හැර කඳවුරු ප්‍රදේශයේ වෙන ස්ථානයක, කිසිම කෙනෙකු මනුෂ්‍ය ආහාරය සඳහා සතකු මැරීම හෝ ඝාතනය කිරීම නොකළ යුතුය. සතුන් මැරීම කෙරෙන එවැනි ස්ථානයක් පිරිසිදුව තබා ගැනීම ගැන සතුන් මැරීම කරන පුද්ගලයා වගකිව යුතුය.

17. කඳවුරු ප්‍රදේශය ඇතුළත හෝ එම ප්‍රදේශයේ සීමාවන්හි සිට සැතපුමක අරයක් ඇතුළත හෝ සහකාර පොලිස් අධිකාරීගෙන් ඒ සඳහා පළමුව අවසර නොගෙන කිසිම අයකු විසින් ගිනිකෙළි හෝ තුවක්කු ආදී වෙඩි තැබීමේ උපකරණ පත්තු නොකළ යුතුය.

18. කිසිම කෙනෙකු විසින් කඳවුරු ප්‍රදේශයේ සිට සැතපුමක අරය ඇතුළත පහත සඳහන් දේ නොකළ යුතුය :—

(1) සැණකෙළි සහ නැටුම් පැවැත්වීම.
(2) නාට්‍ය රඟපෑම.
(3) සූදු ක්‍රීඩා සහ ලොතරැයි පැවැත්වීම.
(4) මද්‍යසාර මත්පැන් විකිණීම.
(5) ශබ්ද විකාශන උපකරණ මගින් දැන්වීම් ප්‍රචාරය කිරීම.
(6) ආගමට පටහැනි සහ බෞද්ධ විරෝධී පොත් පත් බෙදා හැරීම.

19. කිසිම කෙනෙකු විසින් කඳවුරු ප්‍රදේශය තුළ පහත සඳහන් කිසිවක් නොකළ යුතුය :—

(1) ආහාර විකිණීම සඳහා කඳවුරු සීමාව තුළ වෙන් කරන ලද ප්‍රදේශ ඇතුළත හැර වෙන ස්ථානයක ආහාර විකිණීම.

(2) වෙළෙඳ භාණ්ඩ විකිණීම සඳහා නියමිත ස්ථානයක හැර මවන ස්ථානයක ඒවා විකිණීම.

(3) ගස්වල අතු කැපීම.

(4) ආගමික පුද පූජාවන්ට බාධා වන ආකාරයේ හඬ නගන කෙළිබඩු භාවිතා කිරීම.

(5) ආගමික පුද පූජාවන් හා සම්බන්ධ නොවූ සංගීත හා ගායක කණ්ඩායම් සංවිධානය කිරීම හෝ ඒවාට සහභාගී වීම.

(6) බීමත්ව සිටීම සහ වන්දනාකරුවන්ට හිරිහැරවන ලෙස හැසිරීම.

20. (1) මේ නියෝගවල පහත සඳහන් විධිවිධාන වෙසක් සහ පොසොන් වන්දනා කාලවලදී ක්‍රියාත්මක විය යුතුය :—

(2) වෙසක් සහ පොසොන් වන්දනා කාල යනුවෙන් අදහස් විය යුත්තේ වෙසක් මස පසළොස්වක දින සහ පොසොන් මස පසළොස්වක දිනය. වෙසක් වන්දනා කාලය සඳහා වෙසක් පසළොස්වක දිනයට ප්‍රථම දින සිට වෙසක් පසළොස්වක දිනයට පසුව දින දෙකක් දක්වාත්, පොසොන් වන්දනා කාලය සඳහා පොසොන් පසළොස්වක දිනයට ප්‍රථම දින සිට පොසොන් පසළොස්වක දිනට පසුව දින තුනක් දක්වාත් වූ කාලය තුළ මේ නියෝග ක්‍රියාත්මක විය යුතුය.

(3) දඹුල්ල-මාතලේ මහා මාර්ගයෙහි අංක 45/1 දරන බෝක්කුවටත් නිස්සංක මාවත සහ දඹුල්ල-මාතලේ මහා මාර්ගය සන්ධිවන ස්ථානයටත් (නානායම අසල) අතර වූ මහා මාර්ග කොටසෙහි කිසිම කෙනෙකු මෝටර් රථයක් නතර කිරීම හෝ නවත්වා තැබීම නොකළ යුතුය.

(4) දඹුලු විහාරේ අධිකාරීන්ට හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තු වලට හෝ අයත් වූ මෝටර් වාහනයකට හැර වෙන මෝටර් වාහනයකට ප්‍රධාන දොරටුවෙන් හෝ පිරුවන් දොරටුවෙන් හෝ ඉඩමට ඇතුළුවීමට අවසර නොදිය යුතුය. තවද කිසිම වාහනයකට විහාර මළුවෙහි හෝ දඹුලු විහාරයෙහි මුදුනට දිවෙන මාර්ගයෙහි හෝ නතර කිරීමට හා නවත්වා තැබීමට අවසර නොදිය යුතුය.

(5) වාහන නතර කරන බිම් ආණ්ඩුවේ ඒජන්ත සහ පොලීසිය විසින් වෙන් කොට දැන්වීම් පුවරු මගින් දක්වනු ලබන ස්ථාන විය යුතුයි.

(6) මෙම නියෝගවල 3, 4, 5 යන ඡේදයන්හි සඳහන් කෙරුණු ස්ථානවල නිල ඇඳුමින් සැරසී තමාගේ රාජකාරියෙහි යෙදී සිටින පොලිස් නිලධාරියකු විසින් මෝටර් වාහන යක් නවත්වන ලෙස හෝ පස්සට ගන්නා ලෙස හෝ එහි වේගය අඩුකරන ලෙස හෝ ආපසු හරවා යන ලෙස හෝ අසුවල් පැත්තෙන් යන ලෙස හෝ අසුවල් රථ පේලියට අනුකූලව යන ලෙස හෝ දෙනු ලබන සියලුම වාචික අණ හෝ සංඥාවන් කවර මෝටර් වාහනයක වුවද රියැදුරා විසින් පිළිපැදිය යුතුය.

(7) මෙම නියෝගවල "මෝටර් වාහනය" යන්නෙහි අර්ථ නිරූපනය (203 වැනි අධිකාරය වන) මෝටර් ප්‍රවාහන පනතේ ඊට දී ඇති අර්ථ නිරූපනය ම වේ.

## උපලේඛනය

මාතලේ දිස්ත්‍රික්කයෙහි දඹුල්ලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයෙහි පාදෙනියේ ග්‍රාමසේවක කොට්ඨාශයට අයත් වන මුළු ප්‍රදේශය කඳවුරු ප්‍රදේශය යනුවෙන් අදහස් වේ. එහි මායිම් වනුයේ—

උතුරට : උල්පොතඇල සහ පී. පී. 87076 දරණ සැලැස්මේ දක්වා ඇති විහාර ඉඩම හරහා දඹුලු විහාරය දක්වා දිවෙන මාර්ග යෙහි දෙපැත්තෙන් අඩි 50 ක් අත්හැර ඉතිරිවන කොටස ;

නැගෙනහිරට : පී. පී. 87076 දරන සැලැස්මේ දක්වා ඇති, විහාර ඉඩම හරහා දඹුල්ල විහාරය දක්වා දිවෙන මාර්ගයෙහි දෙ පැත්තෙන් අඩි 50 ක් අත්හැර ඉතිරි කොටස. 173998 දරන සැලැස්මෙහි සහ පී. පී. 173999 දරන සැලැස්මෙහි දක්වා ඇති පෞද්ගලික ඉඩම්. මාතලේ-ත්‍රිකුණාමලය ර. වැ. දෙ. මාර්ගයෙහි නැගෙනහිර මායිම සහ ගම්වැසියන්ට බදුදෙන ලද විහාර ඉඩම් ;

දකුණට : බද්දට දෙන ලද විහාර ඉඩම් හරහා දිවෙන ප්‍රධාන මායි යට ප්‍රවේශ වන මාර්ගය, ඒ. ඇම්. හීන්බන්ඩා, ඒ. ඇස්. ඇම්. ජයසිංහ, යු. කේ. ජී. රත්හාමි යන අය විසින් බද්දට ගන්නා ලද ඉඩම්, කන්දෙන් වැටුණ ඇල සහ පී. පී. 87076 දරන සැලැස්මේ දක්වා ඇති, විහාර ඉඩම් හරහා දඹුලු විහා රය දක්වා දිවෙන මාර්ගයන්හි දෙපැත්තෙන් අඩි 50ක් අත්හැර ඉතිරි කොටස ;

බටහිරට : පී. පී. 87076 දරන සැලැස්මේ දක්වා ඇති විහාර ඉඩම් හරහා දඹුලු විහාරය දක්වා දිවෙන මාර්ගයෙහි දෙපැත්තෙන් අඩි 50ක් අත්හැර ඉතිරි කොටස සහ ඒ. ඇස්. ඇම්. ජය සිංහ, ඩබ්ලිව්. ජී. සෙනෙවිරත්න, යු. කේ. ජී. රත්හාමි සහ ඒ. ඇම්. හීන්බන්ඩා විසින් බද්දට ගන්නා ලද විහාර ඉඩම්.

3-99/1

ඇල්. ඩී.—බී. 11/60.

## වන්දනා ගමන් ආඥාපනත

(175 වැනි අධිකාරය වන) වන්දනා ගමන් ආඥාපනතේ 2 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල අනුව ස්වදේශ කටයුතු භාර ඇමතිතුමා විසින් සම්පාදනය කරන ලද නියෝග.

ඩී. දහනායක,
ස්වදේශ කටයුතු භාර ඇමති.

1970 මාර්තු 2 වැනි දින,
කොළඹ.

### නියෝග

1. මෙම නියෝග 1970 වහකෝට්ටේ සාන්ත අන්තෝනි සිද්ධස්ථානය පිළිබඳ නියෝග වශයෙන් හැඳින්විය හැක.

2. මෙම නියෝගවල—

"කඳවුරු ප්‍රදේශ" යනුවෙන් මෙහි උපලේඛයෙහි දක්වා ඇති ප්‍රදේශය අදහස් වේ.

"ආණ්ඩුවේ ඒජන්ත" යනුවෙන් මාතලේ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත අදහස් වේ.

"සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී" යනුවෙන් දඹුල්ලේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී අදහස් වේ.

"සහකාර පොලිස් අධිකාරී" යනුවෙන් මාතලේ සහකාර පොලිස් නිලධාරී අදහස් වේ, සහ

"ගුරු ප්‍රසාදි" යනුවෙන් වහකෝට්ටේ සාන්ත අන්තෝනි සිද්ධස්ථානයේ ගුරු ප්‍රසාදි තුමා අදහස් වේ.

3. මෙම නියෝග මාතලේ දිස්ත්‍රික්කයේ වහකෝට්ටේ සාන්ත අන්තෝනි සිද්ධස්ථානය වන්දනා කරන සෑම වන්දනා ගමනකටම අදාළ විය යුතුය.

4. කඳවුරු ප්‍රදේශය ගුරු ප්‍රසාදිතුමාගේ සාමාන්‍ය පාලනය යටතේ පැවතිය යුතු අතර, සහකාර පොලිස් අධිකාරී සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී එතුමාට මේ කටයුත්තෙහි දී සහාය දිය යුතුය. ගුරු ප්‍රසාදි තුමා නැති අවස්ථාවලදී එවකට ස්ථානය භාරව සිටින ගුරු ප්‍රසාදි තුමාගේ පරිපාලනය යටතේ කඳවුරු ප්‍රදේශය පැවතිය යුතුය. මෙම නියෝග යටතේ ආණ්ඩුවේ ඒජන්ත, සහකාර පොලිස් අධිකාරී හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී යන නිලධාරීන් පාවිච්චි කරන බලතල, එම අය නැති අවස්ථාවල දී පිළිවෙළින් ගලේවල, ප්‍රාදේශීය ආදායම් නිලධාරී, කඳවුරේ සිටින ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරී සහ මහජන සෞඛ්‍ය පරීක්ෂක යන නිලධාරීන් විසින් පාවිච්චි කළ හැකි වේ.

5. ගුරු ප්‍රසාදිතුමාට පහත සඳහන් බලතල තිබිය යුතුය :—

(අ) නෑම, සේදීම, වතුර ඇදීම, බීම සහ ගෘහකටයුතු සඳහා ජලය පාවිච්චි කිරීමට වෙන වෙනම ස්ථාන වෙන් කිරීම.

(ආ) වන්දනාකරුවන්ට දෙනු ලබන සියලුම ආහාර බෙදාහැරීම ක්‍රමවත් කිරීම.

(ඇ) රෝගී වන වන්දනාකරුවන්ගේ වාසය සඳහා ස්ථාන වෙන් කිරීම, ඔවුන් සහ ගමන් කිරීමට නොහැකි තත්ත්වයක සිටින අය සමග වෙනත් අයගේ සම්බන්ධකම් ක්‍රමවත් කිරීම හෝ තහනම් කිරීම.

(ඈ) ගොනුන් සහ කරත්ත නතර කිරීමටද, කාර්, බස් සහ වෙනත් මෝටර් රථ වාහන නතර කිරීමට ද ස්ථාන වෙන් කිරීම සහ වෙන ස්ථාන ඒ සඳහා පාවිච්චි කිරීම තහනම් කිරීම.

(ඉ) භෝජන ශාලා සහ කඩ මඩු සඳහාද, සතුන් සහ කුරුල්ලන් මැරීම සඳහා ද ස්ථාන වෙන් කිරීම සහ ඒ සඳහා අන් ස්ථානයන් පාවිච්චි කිරීම තහනම් කිරීම.

6. තත් කාර්යය සඳහා ගුරු ප්‍රසාදිතුමා විසින් වෙන්කළ හෝ අනුමත කළ හෝ ස්ථානයක හැර වෙන අන් කිසි ස්ථානයක කිසිම අයකු මල මූත්‍ර පහ නොකළ යුතුය.

7. කැලි කසළ දැමීම සඳහා ගුරු ප්‍රසාදිතුමාගේ අනුමැතිය ඇතිව වෙන් කරන ලද ස්ථානයකට හෝ භාජනයකට හෝ මිස, කඳවුරු ප්‍රදේශයේ වෙන තැනක කිසිම අයකු විසින් ඝන හෝ ද්‍රව කැලි කසළ කිසිවක් නොදැමිය යුතුය.

8. කිසිම කෙනකු විසින් කඳවුරු ප්‍රදේශයේ සිට සැතපුමක අරය ඇතුළත පහත සඳහන් ක්‍රියාකාරිත්වයන් නොකළ යුතුය :—

(1) සැණකෙළි සහ නැටුම් කණ්ඩායම්.

(2) වේදිකා නාට්‍ය රඟපෑම්.

(3) සූදු ක්‍රීඩා සහ ලොතරැයි.

(4) මත්පැන් විකිණීම.

(5) ශබ්ද විකාශන උපකරණ මගින් දැන්වීම් ප්‍රකාශ කිරීම.

(6) ආගමට පටහැනි හා කතෝලික විරෝධි පොත්පත් බෙදා හැරීම.

9. කිසිම කෙනකු විසින් කඳවුරු ප්‍රදේශය තුළ පහත සඳහන් කිසිවක් නොකළ යුතුය :—

(1) ආහාර විකිණීම සඳහා වෙන් කරන ලද ප්‍රදේශ ඇතුළත හැර වෙන ස්ථානයක ආහාර විකිණීම.

(2) වෙළෙඳ භාණ්ඩ විකිණීම සඳහා නියමිත ස්ථානයක හැර වෙන ස්ථානයක ඒවා විකිණීම.

(3) පොල්ගස් ඇතුළුව ගස්වල අතු කැපීම.

(4) දේවස්ථානයේ පූජාවන්ට බාධා කරන අන්දමේ හඬ නගන කෙළිබඩු භාවිතා කිරීම.

(5) ආගමික පූජාවන් හා සම්බන්ධ නොවූ සංගීත සහ ගායක කණ්ඩායම් සංවිධානය කිරීම හෝ ඒවාට සහභාගි වීම.

(6) බීමත්ව සිටීම සහ වන්දනාකරුවන්ට හිරිහැර වන ලෙස හැසිරීම.

10. (1) වෙළඳාම සඳහා වෙළඳ ද්‍රව්‍ය තැබීම පිණිස ගුරු ප්‍රසාදිතුමා විසින් කඳවුරු ප්‍රදේශය තුළ වෙන් නොකරන ලද ස්ථානයක කිසිම අයකු කිසිම වෙළඳ ද්‍රව්‍යයන් විකිණීම සඳහා නොතැබිය යුතුය.

(2) සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි විසින් අපථ්‍ය යැයි ප්‍රකාශයට පත් කරන ලද කිසිම ආහාර ද්‍රව්‍යයක් කිසිම අයකු විසින් නොවිකිණිය යුතුය.

(3) අපථ්‍ය යැයි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා විසින් ප්‍රකාශයට පත් කරන ලද ඕනෑම ආහාරයක් ඔහු විසින් අත් අඩංගුවට ගෙන විනාශ කිරීම නීත්‍යානුකූල විය යුතුය.

11. (1) සියලුම භෝජනාගාර හා කෝපි සහ තේ කඩ පිරිසිදුව ද, සනීපය රැකෙන අයුරෙන් ද පවත්වා ගෙන යා යුතුය.

(2) විකිණීම සඳහා තබනු ලබන සියලුම කේක් වර්ග, රස කැවිලි වර්ග සහ පිසන ලද වෙනත් ආහාර ද්‍රව්‍ය නිසියාකාරයෙන් තනන ලද මැසි නිවාරණ වීදුරු පෙට්ටිවල තැබිය යුතුය.

(3) තේ මන්ඩි, කෝපි, කිරි, ඉඳුල් කිසිවක් හෝ ඉවුම් පිහුම්වලදී ඉවත දමන දෑ කිසිවක් හෝ වෙනත් කැලි කසළ හෝ බිම නොදැමිය යුතුය. එවැනි කැලි කසළ සනීපාරක්ෂක බලධාරීන් විසින් ගෙන යාම සඳහා සෑම විටම සූදානම් කොට මෙහි මින්මතු නියම කර ඇති ආකාරයේ භාජනවල දමා තැබිය යුතුය.

(4) වෙළඳාමක් හෝ ව්‍යාපාරයක් සඳහා පාවිච්චි කරනු ලබන සෑම ගොඩනැගිල්ලකට, නිර්මාණයකට හෝ ස්ථානයකටම ලීයෙන් හෝ ලෝහයෙන් සාදන ලද, ඝන අඩි 4½ ක ප්‍රමාණයේ ධාරිතාවක් සහිත කුණු බාල්දියක් තිබිය යුතු වේ. එම ගොඩනැගිල්ලේ, නිර්මාණයේ හෝ ස්ථානයේ එක්කාසු වන සියලුම කැලි කසළ එම කුණු බාල්දියේ දැමිය යුතුවේ. තවද, එම බාල්දියට කසළ දමන හෝ එයින් කසළ ඉවත් කරන අවස්ථාවල දී හැර අන් හැම විටකදීම, ලී හෝ ලෝහ පියනකින් එම බාල්දිය වසා තැබිය යුතුය.

12. බෝවෙන රෝගයකින් පෙළෙන කිසිම කෙනෙක් කඳවුරු ප්‍රදේශයට ඇතුළු නොවිය යුතුය.

13. බෝවෙන ලෙඩකින් පෙළෙන රෝගියකු කඳවුරු ප්‍රදේශයට කැඳවාගෙන ඒම හෝ කඳවුරු ප්‍රදේශයට ඇතුළුවීමට එවැනි රෝගියකුට ආධාර කිරීම හෝ අනුබලදීම හෝ කිසිවකු විසින් නොකළ යුතුය.

14. උත්සව කාලයෙහි දී කඳවුරු ප්‍රදේශය තුළ කිසියම් වසංගත රෝගයක් පැන නැගුණහොත් කඳවුරු ප්‍රදේශය හැර යන ලෙස ආණ්ඩුවේ ඒජන්ත, ගුරුප්‍රසාදි හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි විසින් වන්දනාකරුවන්ට විධාන කිරීමත්, කවර මගින්, කවර වාහනයකින්, නොහොත් කවර අයුරකින් වන්දනාකරුවන් පිටව යායුතු දැයි නියම කිරීමත් නීත්‍යානුකූල විය යුතුය.

15. කඳවුරු ප්‍රදේශය ඇතුළත දී බෝවෙන රෝගයක් වැළඳු සෑම අයකු ද, එබඳු බෝවෙන රෝගයක් වෙනත් අයකුට වැ ඇති බව දැන දැනම එම වෙනත් අය සමඟ පදිංචිව සිටින අයකුද එම කාරණය පිළිබඳව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිට දන්වා සිටිය යුතුය.

16. ගුරු ප්‍රසාදිතුමා ගෙන් පළමුව අවසරය ලබාගෙන මිස කි අයකු විසින් කඳවුරු ප්‍රදේශය ඇතුළත වීදියක් වශයෙන් පාවි කරනු ලබන නොහොත් ඒ සඳහා වෙන්කොට ඇති භූමියක් අ ලෙස ඇඳාගෙන කඩමඩුවක් සෑදීම හෝ ගොඩනැගිල්ලක් විශාල කි හෝ නොකළ යුතුය.

17. මනුෂ්‍ය ආහාරය සඳහා සතුන් මැරීම පිණිස ගුරු ප්‍රසාදි විසින් අනුමත කරන ලද හෝ විශේෂයෙන්ම ඒ සඳහා වෙන් කර ලද ස්ථානවල හැර, කඳවුරු ප්‍රදේශයේ වෙන ස්ථානයක, කි කෙනකු විසින් මනුෂ්‍ය ආහාරය සඳහා සතකු මැරීම හෝ ඝාතන කිරීම නොකළ යුතුය. සතුන් මැරීම කෙරෙන එවැනි ස්ථාන පිරිසිදුව තබා ගැනීම සම්බන්ධයෙන් සතුන් මැරීම කරන පුද්ගල වග කිව යුතුය.

18. කඳවුරු ප්‍රදේශය ඇතුළත හෝ එම ප්‍රදේශයේ සීමාවන් සිට සැතැපුමක අරයක් ඇතුළත හෝ සහකාර පොලිස් අධිකාරිගෙ ඒ සඳහා පළමුව අවසර නොගෙන කිසිම අයකු රතිඤ්ඤා ෙ තුවක්කු පත්තු නොකළ යුතුය.

19. (1) ඉහත සඳහන් උත්සව කාලයේ දී හෝ උත්සව හෝ පෙරහ ආදියක් පැවැත්වෙන දිනයක් හැටියට ගුරු ප්‍රසාදිතු විසින් ප්‍රකාශකරනු ලබන දිනක මෙම නියෝගවල පහ දැක්වෙන විධිවිධාන ක්‍රියාත්මක විය යුතුය :—

(2) දේවසථානයේ අධිකාරින්ට හෝ ආණ්ඩුවේ ප්‍රස්තු දෙපාර්තමේන්තුවලට හෝ අයත් වූ මෝටර් වාහනයක හැර වෙන මෝටර් වාහනයකට ප්‍රධාන දොරටුවෙන දේවස්ථාන ඉඩමට ඇතුළුවීමට හෝ දේවස්ථාන අංග යෙහි හෝ ඒ අසල හෝ නතර කිරීමට හෝ නවත් තැබීමට හෝ අවසර නොදිය යුතුය.

(3) මෙම නියෝගවල 5 (ඇ) සහ 19 (2) යන ඡේදයන් සඳහන් කෙරුණු ස්ථානවල නිල ඇඳුමින් සැරසී තමාගෙ රාජකාරියෙහි යෙදී සිටින පොලිස් නිලධාරියකු විසින් මෝටර් වාහනයක් නවත්වන ලෙස හෝ පස්සට ගන්න ලෙස හෝ එහි වේගය අඩු කරන ලෙස හෝ ආපසු හරව යන ලෙස හෝ අසුවල් පැත්තෙන් නොගොස් අසුවල් ර පේළියට අනුකූලව යන ලෙස හෝ දෙනු ලබන සියලු වාචික අණ හෝ සංඥවන් කවර මෝටර් වාහනයක වුව රියැදුරා විසින් පිළිපැදිය යුතුය.

(4) මෙම නියෝගවල "මෝටර් වාහනය" යන්නෙහි අර් නිරූපණය (203 වැනි අධිකාරය වන) මෝටර් රථ ප්‍රවාහන පනතේ ඊට දී ඇති අර්ථ නිරූපණයම වේ.

## උපලේඛනය

මාතලේ දිස්ත්‍රික්කයෙහි ගලේවෙල ප්‍රාදේශීය ආදායම් නිලධාරිගෙ කොට්ඨාශයෙහි, වහකෝට්ටේ ග්‍රාමසේවක කොට්ඨාශයට අයත්ව පහත දැක්වෙන මායිම්වලින් වට වූ මුළු වහකෝට්ටේ ප්‍රදේශය කඳවුරු ප්‍රදේශය යන්නෙන් අදහස් කැරේ :—

උතුරට : බුත්සරණපිටියේ සිට වහකෝට්ටේ, කලුගල සහ තැඹිගි යාව කුඹුර දක්වා දිවෙන ගම්සභා මාර්ගයෙහි උතුරු මායිම;

දකුණට : (අකුරම්බොඩ හරහා දිවෙන) ගලේවෙල-මාතලේ රජයේ වැඩ දෙපාර්තමේන්තු මාර්ගයෙහි දකුණු මායිම ;

නැගෙනහිරට : වහකෝට්ටේ වැව ;

බටහිරට : බුත්සරණපිටියේ සිට වහකෝට්ටේ සහ කලුගල දක්වා දිවෙන ගම්සභා මාර්ගයෙහි බටහිර මායිම.

3-99/2

---

එල්. ඩී.—බී. 79/49.

## ආහාර හා ඖෂධ පනත

(216 වැනි අධිකාරය වූ) ආහාර හා ඖෂධ පනතේ 41(3) වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ඇමතිවරයා විසින් පනවනු ලබන ආඥාවකි.

ඊ. ඇල්. සේනානායක
සෞඛ්‍ය ඇමති.

1970 ජනවාරි 5 වන දින,
කොළඹ දීය.

### ආඥාව

රජයේ රස පරීක්ෂක, මේ ආඥාව බල පවත්නා තාක් කල් අම්බලන්තොට සුළු නගර සභාවේ පරිපාලන ප්‍රදේශය සඳහා අනුමත කරන ලද පොදු රස පරීක්ෂකයකු විය යුතු බැව් මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

3-95

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## රත්නපුර දිස්ත්‍රික්කයේ නවදුන් කෝරළේ හා කුරුවිටි කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශ නැවත සකස් කිරීම

1970 මාර්තු මස 15 වැනි දින සිට රත්නපුර දිස්ත්‍රික්කයේ නවදුන් කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය හා කුරුවිටි කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය යන කොට්ඨාශ දෙක ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශ තුනකට බෙදා, රත්නපුර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය, කුරුවිටි කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය හා නවදුන් කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය යනුවෙන් නැවත සංස්ථාපනය කර ඇති බව මහජනයාගේ දැනගැනීම පිණිස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

2. (අ) රත්නපුර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය පහත සඳහන් ග්‍රාම සේවක කොට්ඨාශ වලින් සමන්විත වේ.

| කොට්ඨාශ අංක | | |
|---|---|---|
| 151 | ... | දේවාලේ ගාව |
| 152 | ... | ගොඩිගමුව |
| 152 ඒ | ... | රත්නපුර නගරය |
| 153 | ... | ඇල්ලෙගෙදර |
| 162 | ... | ගිලීමලේ උතුර |
| 162 ඒ | ... | කුඩාව |
| 163 | ... | ගිලිමලේ දකුණ |
| 164 | ... | බඹරබොටුව කුඩාබාගේ බටහිර |
| 164 ඒ | ... | බඹරබොටුව කුඩාබාගේ නැගෙනහිර |
| 165 | ... | බඹරබොටුව මහබාගේ |
| 182 | ... | මුවගම |
| 183 | ... | හත්ගමුව |
| 184 | ... | නිරිඇල්ල |
| 185 | ... | ඇලපාත |
| 187 | ... | රද්දැල්ල |
| 188 | ... | දෙල්ලබඩ |
| 189 | ... | දම්බුළුවන. |

(ආ) කුරුවිටි කෝරළේ ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශය පහත සඳහන් ග්‍රාම සේවක කොට්ඨාශ වලින් සමන්විත වේ.

| කොට්ඨාශ අංක | | |
|---|---|---|
| 136 | ... | කැත්දන්ගමුව ඉහලගම |
| 136 ඒ | ... | කැත්දන්ගමුව නගරය |
| 137 | ... | වලවිට |
| 138 | ... | ඉද්දමල්ගොඩ |
| 139 | ... | කලටුවාව බටහිර |
| 139 ඒ | ... | කලටුවාව නැගෙනහිර |
| 140 | ... | කැත්දන්ගමුව පහලගම |
| 141 | ... | බුළුගහපිටිය |
| 142 | ... | කිරිපෝරුව |
| 142 ඒ | ... | හිඳුරන්ගල |
| 143 | ... | කරඳන උතුර |
| 143 ඒ | ... | කරඳන දකුණ |
| 144 | ... | යටිපව්ව |
| 145 | ... | කිරිඇල්ල |
| 146 | ... | තලාවිටිය |
| 147 | ... | එල්ලාවල |
| 148 | ... | පොහොරබාව |
| 149 | ... | මුදුන්කොටුව |
| 150 | ... | දොඩම්පේ |
| 154 | ... | වලඳුර |
| 155 | ... | කුරුවිට |
| 156 | ... | තෙප්පනාව |
| 157 | ... | කඳන්ගොඩ-වතුයාය |
| 158 | ... | පුස්සැල්ල |
| 160 | ... | ඇඳිරියන්වල |
| 161 | ... | එරත්න. |

(ඇ) නවදුන් කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය පහත සඳහන් ග්‍රාම සේවක කොට්ඨාශ වලින් සමන්විත වේ.

| කොට්ඨාශ අංක | | |
|---|---|---|
| 166 | ... | කුට්ටාපිටිය |
| 167 | ... | ගනේගම |
| 168 | ... | දෙනවක උඩකඩ |
| 169 | ... | මොරතොට |
| 170 | ... | පනාවැන්න |
| 171 | ... | දෙනවක පාතකඩ |
| 172 | ... | ලෙල්ලෝපිටිය |
| 173 | ... | කරවිට |
| 174 | ... | නිවිතිගල |
| 175 | ... | තොරගල්ල |
| 176 | ... | දොලොස්වල |
| 177 | ... | දෙල්වල |
| 178 | ... | බෝපැත්ත |
| 179 | ... | මාරපන |
| 180 | ... | හකමුව |
| 181 | ... | බටුගෙදර |

3. පසත සඳහන් මහ නගර සභා, සුළු නගර සභා සහ ගම්සභා ප්‍රදේශ ඒ ඒ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශවලට අඩංගු වනවා ඇත.

(අ) රත්නපුර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය.—රත්නපුර මහ නගර සභා ප්‍රදේශයෙන් කොටසක්, කුරුවිට ගම්සභා ප්‍රදේශයෙන් කොටසක්, ගිලීමලේ ගම්සභාව ප්‍රදේශයෙන් කොටසක්, බඹරබොටුව ගම්සභා ප්‍රදේශය, නවදුන් කෝරලේ පල්ලේ පත්තු ගම්සභා ප්‍රදේශය.

(ආ) කුරුවිටි කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය.—කුරුවිටි කෝරළේ පල්ලේ පත්තු ගම්සභා ප්‍රදේශය, කුරුවිටි කෝරළේ මැද පත්තු ගම්සභා ප්‍රදේශය, එල්ලාවල ගම්සභා ප්‍රදේශය, කුරුවිට ගම්සභා ප්‍රදේශයෙන් කොටසක් හා ගිලීමලේ ගම්සභා ප්‍රදේශයෙන් කොටසක්.

(ඇ) නවදුන් කෝරලේ ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශය :—රත්නපුර මහ නගර සභාවෙන් කොටසක්, පැල්මඩුල්ල සුළු නගර සභා ප්‍රදේශයෙන් කොටසක්, මාරඅන ගම්සභා ප්‍රදේශයෙන් කොටසක්, පැල්මඩුල්ල ගම්සභා ප්‍රදේශය හා නිවිතිගල ගම්සභා ප්‍රදේශය.

4. පහත සඳහන් ගම්බද උසාවි ඒ ඒ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශවල අධිකරණ බල පවත්වනවා ඇත.

(අ) රත්නපුර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය :—

(1) කුරුවිට ගම්බද උසාවිය
(2) කොටාමුල්ල ගම්බද උසාවිය

(ආ) කුරුවිටි කෝර්ලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය :—

(1) ඇහැළියගොඩ කැත්දන්ගමුව ගම්බද උසාවිය
(2) කුරුවිට ගම්බද උසාවිය
(3) කිරිඇල්ල ගම්බද උසාවිය

(ඇ) නවදුන් කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය :—

(1) පැල්මඩුල්ල ගම්බද උසාවිය
(2) මාරපන ගම්බද උසාවිය

5. නව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශ පහත සඳහන් පාර්ලිමේන්තු ඡන්ද කොට්ඨාශවලට අයත් වනවා ඇත.

(අ) රත්නපුර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය :—

(1) අංක 139—රත්නපුර ඡන්ද කොට්ඨාශයෙන් කොටසක්
(2) අංක 140—පැල්මඩුල්ල ඡන්ද කොට්ඨාශයෙන් කොටසක්
(3) අංක 143—නිවිතිගල ඡන්ද කොට්ඨාශයෙන් කොටසක්

(ආ) කුරුවිටි කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය :—

(1) අංක 138—කිරිඇල්ල ඡන්ද කොට්ඨාශය
(2) අංක 139—රත්නපුර ඡන්ද කොට්ඨාශයෙන් කොටසක්.

(ඇ) නවදුන් කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය :—

(1) අංක 139—රත්නපුර ඡන්ද කොට්ඨාශයෙන් කොටසක්
(2) අංක 140—පැල්මඩුල්ල ඡන්ද කොට්ඨාශයෙන් කොටසක්
(3) අංක 143—නිවිතිගල ඡන්ද කොට්ඨාශයෙන් කොටසක්.

6. මෙම ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශවල කායඞ්ල පහත සඳහන් ස්ථානයන්හි පිහිටා ඇත.

(අ) රත්නපුර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය—රත්නපුර

(ආ) කුරුවිටි කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය—කුරුවිට

(ඇ) නවදුන් කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය—බටුගෙදර.

ඒ. ඊ. ගොගර්ලි මොරගොඩ,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 මාර්තු මස 1 දින,
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
කොළඹ 7.

3-104

---

## ලංකා සේවිංස් බැංකුවේ පොලී පිළිබඳ දැන්වීමයි

මුදල් තැන්පත් කරන්නන්ට 1970 වර්ෂය වෙනුවෙන් ඉතිරි කිරීමේ තැන්පත් සඳහා ගෙවනු ලබන පොලිය සියයට 4 ක් බවත් ස්ථාවර තැන්පත් සඳහා ගෙවනු ලබන පොලිය සියයට 4½ක් බවත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

වී. ජේ. කාරියවසන්,
කළමනාකරු.

1970. 3. 13 දින,
ලංකා සේවිංස් බැංකුව,
කොළඹ 1.

3-158

---

## සමූපකාර සමිති පිළිබඳ ආඥාපනත (124 වෙනි අධිකාරය)

### සමූපකාර සමිති වසා දැමීමේ කටයුතු අවසන් කිරීම

පහත සඳහන් සමූපකාර සමිති ඒ එක එක සමිතියේ නම ඉදිරියෙහි සඳහන් කර තිබෙන දිනයෙහි වසා දමන ලද බව, සමූපකාර සමිති පිළිබඳ ආඥාපනතේ 52(2) වෙනි වගන්තිය අනුව, මෙයින් දැනුම් දෙනු ලැබේ:—

| | සමිතියේ නම | වසා දමන ලද දිනය |
|---|---|---|
| 1. | සීමාසහිත වරාපිටිය සමූපකාර කඩ සමිතිය ... | 69.12.6 |
| 2. | ඉඹුල්පිටිය එස්ටේට් ලේබර්ස් කෝපරේටිව් ත්‍රිෆ්ට් සොසයිටි ලිමිටඩ් ... ... | 69.12.6 |
| 3. | සීමාසහිත හන්වැල්ල පල්ලේවෙල සමූපකාර කඩ සමිතිය ... ... | 69.12.6 |
| 4. | සීමාරහිත දළුපොතගම සමූපකාර ණය දෙන සමිතිය ... ... | 69.12.6 |
| 5. | සීමාසහිත බටුගම්පල සමූපකාර කිරි පට්ටි සමිතිය ... | 69.12.6 |
| 6. | සීමාසහිත ඩක්වාරි වත්තේ සමූපකාර කඩ සමිතිය ... ... | 69.12.10 |
| 7. | සීමාසහිත දිඹුල්වෙල විවිධසේවා සමූපකාර සමිතිය ... | 70.1.4 |
| 8. | සීමාසහිත වේරගම විවිධ සේවා සමූපකාර සමිතිය ... | 70.1.4 |
| 9. | සීමාසහිත නැඳුරන තරුණ ගොවීන්ගේ ගොවි කාර්මාන්ත සමූපකාර සමිතිය ... ... | 70.1.4 |
| 10. | සීමාසහිත මැද දුම්බර ගම්මුලාදෑනීන්ගේ ඉතිරිකිරීමේ සමූපකාර සමිතිය ... ... | 70.1.4 |
| 11. | සීමාසහිත මරවනාගොඩ දිඹුල්කුඹුර විවිධ සේවා සමූපකාර සමිතිය ... ... | 70.1.4 |
| 12. | සීමාසහිත අළුත්වැව විවිධ සේවා සමූපකාර සමිතිය ... | 70.1.10 |
| 13. | සීමාසහිත දකුණු කැබිල්ලෙවෙල සමූපකාර කඩ සමිතිය ... ... | 70.1.11 |
| 14. | සීමාසහිත වන්කාලෙයි සාන්ත ආනා දැල් වියන්නන්ගේ සමූපකාර සමිතිය ... ... | 70.1.12 |
| 15. | සීමාසහිත කුරුණෑගල සමූපකාර කඩ සම්මිතිය ... | 70.1.13 |
| 16. | සීමාසහිත යටකිඳ සමූපකාර ණයදෙන සමිති සංගමය ... ... | 70.1.13 |
| 17. | සීමාරහිත ගල්ලිනවත්ත සමූපකාර ණයදෙන සමිතිය ... ... | 70.1.21 |
| 18. | සීමාසහිත සකසුරුවම්කම හා මුදල් ඉතිරි කිරීම පිළිබඳ ඉඹුල්පෙ විශාඛා කුළඟන සමූපකාර සමිතිය ... | 70.1.24 |
| 19. | සීමාසහිත අම්බාලේ දෙරලියද්ද දුම්කොළ වවන්නන්ගේ සමූපකාර සමිතිය ... ... | 70.1.24 |

ආර්. බී. රාජගුරු,
සමූපකාර සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්
සහ සමූපකාර සමිති නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්.

1970 පෙබරවාරි මස 28 වෙනි දින,
කොළඹ සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේදීය.

3-47

## මහා මාර්ග දෙපාර්තමේන්තුව

### රථ වාහන ගමනාගමනයට බාධා

බස්නාහිර පළාත — කළුතර දිස්ත්‍රික්කය

**මග්ගොන-මුන්හේන-හල්කන්දවිල පාරේ අංක 4/1 පාලම**

ඉහත සඳහන් පාලම නැවත තැනීම සඳහා, සියලුම රථවාහන වලට 1970.3.5 වැනි දින සිට තව මාස 6ක් (හයක්) වසා දමන බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙමි.

මෙම කාලය තුළදී පයාගල නවුතුඩුව පාරේ හතරවන සැතපුමෙන් හැරී සියලුම රථවාහන වලට ගමන් කිරීමට හැකි වෙනවා ඇත.

සී. ආර්. තිස්සනායගම්,
මහා මාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

මහා මාර්ග දෙපාර්තමේන්තුව,
කොළඹ 1.

3-70

---

## නිවේදනයයි

**1968 අංක 48 දරණ වාරිමාර්ග (සංශෝධන) පනතින් සංශෝධිත (453 වන අධිකාරය වන) වාරිමාර්ග ආඥාපනත**

1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධන) පනතේ 17 වන වගන්තිය මගින් සංශෝධිත ඉහත සඳහන් ආඥාපනතේ 33 වන වගන්තිය යටතේ මහනුවර ආණ්ඩුවේ දිසාපති විසින් සකස් කරන ලද පහත දක්වා ඇති යෝජනා ක්‍රමය ම විසින් අනුමත කරනු ලැබූ බව, ගොවිජන සේවා කොමසාරිස් සෙනෙවිරත්න බණ්ඩා සේනානායක වන මම, 1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධන) පනතේ 19 වන වගන්තිය මගින් සංශෝධිත (ලංකා ව්‍යවස්ථා ප්‍රඥප්ති සංග්‍රහයේ 453 වන අධිකාරය වන) වාරිමාර්ග ආඥාපනතේ 35 වන වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරමි.

එස්. බී. සේනානායක,
ගොවිජන සේවා කොමසාරිස්.

1970.2.18.

**සුළු වාරිමාර්ග වැඩ වැඩිදියුණු කිරීම සඳහා යෝජනා ක්‍රමය**

1. වැඩයේ නම සහ විස්තරය : දේවහන්දිය සියක් බඹේ ඇල අමුණ ජේ/21 (13.31 × 5.15).

2. යෝජනා ක්‍රමය යටතේ ජල සම්පාදනය කළ හැකි ඉඩම් ප්‍රමාණය සහ ඒවායේ ස්වභාවය :—

**පෞද්ගලික ඉඩම්: දළ වශයෙන් අක්කර 41 යි.**
රජයේ ඉඩම් : නැත.

3. එකඟ වූ කොන්දේසි නම් :—

(1) අවශ්‍ය වැඩයේ පහත සඳහන් වැඩ කොටස්, එනම් :—

(අ) අඩි 100 ක් දිග මඩ සොරොව් දෙකක් සහිත අමුණක් ඉදිකිරීම.

(ආ) අඩි 45-50 දිග කුඩා අමුණු 3 ක් ඉදිකිරීම.

(ඇ) අඩි 25 ක් දිග කුඩා අමුණු 1 ක් ඉදිකිරීම.

(ඈ) ඇල දෙපස ආරක්ෂක බැම් ඉදිකිරීම.

ඇස්තමේන්තු කළ වියදම රු. 36,000 දක්වා තැනීම රජය විසින් භාර ගන්නා ලදී.

(2) රජය විසින් ඉහත සඳහන් පරිදි යථෝක්ත වැඩය භාරගෙන තිබීම සලකා එම වැඩය අවසන් කළායින් පසුව එය නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය වන සියළුම කම්කරු ශ්‍රමය සියළුම ගාස්තු රහිතව, මෙම කුඹුරු වල කට්ටි ලැබුම්කරුවන් හා අඳ ගොවියන් සහ යම් කුඹුරක කට්ටි ලැබුම්කරුවන් හෝ අඳ ගොවියන් නොමැත්තෙහි නම් එහි අයිතිකරුවන් විසින් සැපයිය යුතුයි.

(3) මෙම යෝජනා ක්‍රමය යටතේ නියමිත තම කොටස ඉටු කිරීම යම් කුඹුරක කට්ටි ලැබුම්කරුවන්ගෙන් සහ අඳ ගොවීන් ගෙන් යම් කෙනෙක් හෝ යම් කුඹුරක කට්ටි ලැබුම්කරුවන් හෝ අඳ ගොවියන් නොමැත්තෙහි නම් මෙම ඉඩම් වල අයිතිකරුවන්ගෙන් හෝ ඕනෑම පුද්ගලයෙක් සම්සේ පැහැර හැරියහොත්, ආණ්ඩුවේ දිසාපතිවරයා විසින් යම් වෙනත් පුද්ගලයෙකු ලවා එකී කම්කරු ශ්‍රමය ඉටු කරවා ආඥාපනතේ VII වන කොටසේ නියමිත ආකාරයට වියදම් අය කරනු ලැබේ.

3-194

## නිවේදනයයි

**1968 අංක 48 දරණ වාරිමාර්ග (සංශෝධන) පනතින් සංශෝධිත (453 වන අධිකාරය වන) වාරිමාර්ග ආඥාපනත**

1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධන) පනතේ 17 වන වගන්තිය මගින් සංශෝධිත ඉහත සඳහන් ආඥාපනතේ 33 වන වගන්තිය යටතේ මාතලේ ආණ්ඩුවේ දිසාපති විසින් සකස් කරන ලද පහත දක්වා ඇති යෝජනා ක්‍රමය ම විසින් අනුමත කරනු ලැබූ බව, ගොවිජන සේවා කොමසාරිස් සෙනෙවිරත්න බණ්ඩා සේනානායක වන මම, 1968 අංක 48 දරණ වාරිමාර්ග (සංශෝධන) පනතේ 19 වන වගන්තිය මගින් සංශෝධිත (ලංකා ව්‍යවස්ථා ප්‍රඥප්ති සංග්‍රහයේ 453 වන අධිකාරය වන) වාරිමාර්ග ආඥාපනතේ 35 වන වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරමි.

එස්. බී. සේනානායක,
ගොවිජන සේවා කොමසාරිස්.

1970. 2. 18 වන දින.

**සුළු වාරිමාර්ග වැඩ වැඩිදියුණු කිරීම සඳහා යෝජනා ක්‍රමය**

1. වැඩයේ නම සහ විස්තරය.—පල්ලේගම ඉඩමේවෙල අමුණ ඉදිකිරීම.

2. යෝජනා ක්‍රමය යටතේ ජල සම්පාදනය කළහැකි ඉඩම් ප්‍රමාණය සහ එවායේ ස්වභාවය.—

පෞද්ගලික ඉඩම් :—දල වශයෙන් අක්කර 26 යි.

රජයේ ඉඩම් :—දල වශයෙන් අක්කර 24 යි.

3. එකඟවූ කොන්දේසි නම් :—

(1) අවශ්‍ය වැඩයේ පහත සඳහන් වැඩ කොටස් එනම් :—
(i) අමුණ ඉදිකිරීම.
(ii) ඇල වැඩිදියුණු කිරීම.
(iii) ඇල දිගු කිරීම.

ඇස්තමේන්තු කළ වියදම රුපියල් 45,000 දක්වා තැනීම රජය විසින් භාරගන්නා ලදී.

(2) රජය විසින් ඉහත සඳහන් පරිදි යථොක්ත වැඩය භාරගෙන තිබීම සලකා එම වැඩය අවසන් කළායින් පසුව එය නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය වන සියළුම කම්කරු ශ්‍රමය සියළුම ගාස්තු රහිතව, මෙම කුඹුරු වල කට්ටි ලැබුම්කරුවන් හා අඳ ගොවියන් සහ යම් කුඹුරක කට්ටි ලැබුම්කරුවන් හෝ අඳ ගොවියන් නොමැත්තෙහි නම් එහි අයිතිකරුවන් විසින් සැපයිය යුතුයි.

(3) මෙම යෝජනා ක්‍රමය යටතේ නියමිත තම කොටස ඉටු කිරීම යම් කුඹුරක කට්ටි ලැබුම් කරුවන්ගෙන් සහ අඳ ගොවීන් ගෙන් යම් කෙනෙක් හෝ යම් කුඹුරක කට්ටි ලැබුම්කරුවන් හෝ අඳ ගොවියන් නොමැත්තෙහි නම් මෙම ඉඩම් වල අයිතිකරුවන්ගෙන් හෝ ඕනෑම පුද්ගලයෙක් යම්සේ පැහැර හැරියහොත්, ආණ්ඩුවේ දිසාපතිවරයා විසින් යම් වෙනත් පුද්ගලයෙකු ලවා එකී කම්කරු ශ්‍රමය ඉටු කරවා ආඥාපනතේ VII වන කොටසේ නියමිත ආකාරයට වියදම් අය කරනු ලැබේ.

3–114

---

## කළුතර දිස්ත්‍රික්කයේ බටහිර පස්දුන් කෝරළය ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ ග්‍රාම සේවක කොට්ඨාශය ප්‍රතිසංස්ථාපනය කිරීම

1970 මාර්තු මස 15 දින සිට කළුතර පාලන දිස්ත්‍රික්කයේ බටහිර පස්දුන් කෝරළය ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයෙහි අංක 799 දරණ පුහාඹුගොඩ ග්‍රාමසේවක කොට්ඨාශය 799 පුහාඹුගොඩ හා 799ඒ ඇලදූව යනුවෙන් ග්‍රාම සේවක කොට්ඨාශ දෙකකට බෙදා ඇති බව මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

(අ) පහත සඳහන් ගම් අංක 799 දරණ පුහාඹුගොඩ ග්‍රාම සේවක කොට්ඨාශයට ඇතුලත් වේ :—පුහාඹුගොඩ
(ආ) පහත සඳහන් ගම් අංක 799ඒ දරණ ඇලදූව ග්‍රාම සේවක කොට්ඨාශයට ඇතුලත් වේ :—ඇලදූව, ගල්පොත්තවිල

2. මෙම ග්‍රාම සේවක කොට්ඨාශ අයත්වන මහෙස්ත්‍රාත් උසාවිය, ගම්බද උසාවිය, පොලිස් වසම, උප්පැන්න, මරණ සහ විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය, පළාත් පාලන ආයතනයන් සහ මැතිවරණ දිස්ත්‍රික්කය සැම දෙනාගේම දැනගැනීම සඳහා මෙහි පහත දක්වේ :—

| ග්‍රාම සේවක කොට්ඨාශය | මහෙස්ත්‍රාත් උසාවිය | ගම්බද උසාවිය | පොලිස් වසම | උප්පැන්න, මරණ හා විවාහ ලියා පදිංචි කිරීමේ කොට්ඨාශය | පළාත් පාලන ආයතනය | මැතිවරණ දිස්ත්‍රික්කය |
|---|---|---|---|---|---|---|
| 1. 799, පුහාඹුගොඩ ... | මතුගම ... | පයියාගල ... | දොඩන්ගොඩ ... | දොඩන්ගොඩ ... | දොඩන්ගොඩ ගම් සභාව | මතුගම |
| 2. 799ඒ, ඇලදූව ... | මතුගම ... | පයියාගල ... | දොඩන්ගොඩ ... | දොඩන්ගොඩ ... | දොඩන්ගොඩ ගම් සභාව | මතුගම |

1970 පෙබරවාරි මස 27 දින,
කළුතර දී ය.

ලීල් ගුණසේකර,
කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

3–46

---

## කොළඹ දිස්ත්‍රික්කයේ උතුරු අළුත්කුරු කෝරළයේ "ඒ" ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ ග්‍රාමසේවක කොට්ඨාශ ප්‍රතිසංස්ථාපණය කිරීම

1970 මාර්තු මස 15 වැනි දින සිට කොළඹ දිස්ත්‍රික්කයේ උතුරු අළුත්කුරු කෝරළයේ "ඒ" ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයෙහි අංක 57 දරණ ගොඩිගමුව නමින් ග්‍රාමසේවක කොට්ඨාශයක් පිහිටුවා ඇති බව මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

(අ) පහත සඳහන් ගම් අංක 57 දරණ ගොඩිගමුව ග්‍රාමසේවක කොට්ඨාශයට ඇතුළත් වේ.
1. නැගෙණහිර ගොඩිගමුව—බලවල
2. ගලේවත්ත
3. බටහිර ගොඩිගමුව
4. පහල ඕතරවාඩිය

2. මෙම ග්‍රාමසේවක කොට්ඨාශය අයත්වන මහෙස්ත්‍රාත් උසාවිය, ගම්සභා උසාවිය, පොලිස් වසම, උප්පැන්න, මරණ සහ විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය, පළාත්පාලන ආයතනය සහ මැතිවරණ දිස්ත්‍රික්කය සැම දෙනාගේම දැනගැනීම සඳහා මෙහි පහත දක්වමි.

| ග්‍රාමසේවක කොට්ඨාශය | මහෙස්ත්‍රාත් උසාවිය | ගම්බද උසාවිය | පොලිස් වසම |
|---|---|---|---|
| අංක 57—ගොඩිගමුව ... | ... මීගමුව | ... කටාන | ... දිවුලපිටිය<br>1. නැගෙනහිර ගොඩිගමුව—බලවල<br>කොච්චිකඩේ<br>2. ගලේවත්ත<br>3. බටහිර ගොඩිගමුව<br>4. පහළ ඕතරවාඩිය |

| උප්පැන්න, මරණ හා විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය | පළාත් පාලන ආයතනය | මැතිවරණ දිස්ත්‍රික්කය |
|---|---|---|
| ඕතර නැගෙණහිර ... ... | ... කෙහෙල්ඇල්ල ගම්සභාව | ... 8—දිවුලපිටිය |

1970. 2. 27 වැනිද,
කොළඹ දිසාපති කාර්යාලයේදී ය.

ඩී. ආර්. උමගිලිය,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

3–177

## ගැසට් පත්‍රය පලකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උප ලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් ලුවමනා ගැසට් පත්‍රයට දන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කායර්‍යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කායර්‍යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය**

උපලේඛනය

**1970**

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| මාර්තු | 70. 3. 5 බ්‍රහස්පතින්ද | 70. 2.27 සිකුරාද | පෙ.ව. | 12.0 |
| | 70. 3.13 සිකුරාද | 70. 3. 5 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 3.20 සිකුරාද | 70. 3.13 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 3.26 බ්‍රහස්පතින්ද | 70. 3.19 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| අප්‍රේල් | 70. 4. 3 සිකුරාද | 70. 3.25 බදද | ප.ව. | 3.30 |
| | 70. 4.10 සිකුරාද | 70. 4. 3 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 4.17 සිකුරාද | 70. 4. 8 බදද | ප.ව. | 3.30 |
| | 70. 4.24 සිකුරාද | 70. 4.17 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 4.30 බ්‍රහස්පතින්ද | 70. 4.23 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| මැයි | 70. 5. 8 සිකුරාද | 70. 4.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 5.15 සිකුරාද | 70. 5. 8 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 5.22 සිකුරාද | 70. 5.15 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 5.29 සිකුරාද | 70. 5.22 සිකුරාද | ප.ව. | 3.30 |
| ජූනි | 70. 6. 5 සිකුරාද | 70. 5.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.11 බ්‍රහස්පතින්ද | 70. 6. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.18 බ්‍රහස්පතින්ද | 70. 6.11 බ්‍රහස්පතින්ද | පෙ.ව. | 12.0 |
| | 70. 6.25 බ්‍රහස්පතින්ද | 70. 6.18 බ්‍රහස්පතින්ද | පෙ.ව. | 12.0 |

1970 මාර්තු 5 වැනි දින.
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රපිතයි.